

# හඬ

CED ත්‍රෛමාසික පුවත් සඟරාව

CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව දෙවෙනි කලාපය 2017 මැයි




# ආපදා කළමනාකරණයේදී අධ්‍යාපනයේ කාර්යභාරය

**2004** වසරේ සුනාමි තත්ත්වයට පසුව ඇතිවූ දරුණුතම ස්වභාවික ව්‍යාසනය වශයෙන් ඉකුත් මැයි මාසයේ අවසන් භාගයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 10 කට ඉමහත් බලපෑමක් සිදුකල ගංවතුර හා නායයාම් තත්ත්වය හැඳින්විය හැකිය. රජය විසින් නිකුත් කරන ලද නිල සංඛ්‍යාලේඛන වලට අනුව මෙම ව්‍යසනය නිසා පුද්ගලයින් 212 ක් ජීවිතක්ෂයට පත්වූ අතර 630000 ක් බලපෑමට ලක්විය. මෙම තත්ත්වය නිසා සිදුවූ දේපළ හානිය තවමත් තක්සේරුවක් කර නොමැත. ස්වභාවික ආපදා තත්වයන් ඇතිවීමේ ප්‍රවනතාවන් සහ ඒවා සිදුවීමේ වාර ගණන සීඝ්‍රයෙන් ඉහළයාමේ තත්වයක් මැත ඉතිහාසයේ පහසුවෙන් නිරීක්ෂණය කළ හැකියි.

අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කළ සංඛ්‍යාලේඛනවලට අනුව රත්නපුර, මාතර, කෑගල්ල සහ කලුතර දිස්ත්‍රික්කවල පාසල් 146 ක් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් විනාශයට පත්වී ඇත. රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් 65 ක් සම්පූර්ණයෙන්ම විනාශයට පත්වී ඇති අතර මාතර හා කලුතර දිස්ත්‍රික්කවල පාසල් 34 කට බරපතල අලාභහානි සිදුවී ඇත. දිස්ත්‍රික්ක 15 ක පාසල් සිසුන් 120862 ක් මෙම ස්වභාවික ආපදාවේ බලපෑමට ලක් වූ අතර මෙමගින් මරණයට පත් වූ සිසුන් සංඛ්‍යාව 44 ක් වේ. අදවන විට කාළගුණික සහ දේශගුණික තත්වයන් පිළිබඳව සැළකිය යුතු මට්ටමේ නිවැරදිභාවයකින් යුක්තව අනාවැකි පළකිරීමට තරම් තාක්ෂණය දියුණු වී ඇතත් හදිසියේ ඇති වන්නාවූ ස්වභාවික ආපදාවලට සියයට සියයක් සාර්ථකව මුහුණදීමට කිසිදු රටකට හැකිවී නැත. එනමුත් ආපදා සඳහා පෙර සූදානම් වීම, ආපදා කළමනාකරණය යන ක්ෂේත්‍රයන් හි වර්ධනයත් සමගින් ආපදාවන් මගින් සිදුවන ජීවිත හා දේපළ හානි අවදානම් අවම කරගැනීමට සමහර රටවල් සමත් වී තිබෙන අයුරු නිරීක්ෂණය කළ හැකිය.

ආපදාවන් සිදුවන අවස්ථාවන් ප්‍රමාණාත්මකව වැඩිවීමත් එමෙන්ම එමගින් සිදුවන්නා වූ ප්‍රතිවිපාකවල බලපෑම දිනෙන් දින ඉහළයාමත් නිසා නවීන විද්‍යාත්මක මෙන්ම සම්ප්‍රදායික ඥානසම්භාරය උපයෝගී කරගනිමින් ස්වභාවික ආපදාවන් මගින් සිදුවන අනතුරු අවම කරගැනීම සඳහා වූ සැළසුම් සකස් කිරීමට බලධාරීන් කඩිනමින් කටයුතු කළ යුතුවේ. කෙසේ වෙතත් මෙවැනි සූදානමක් අප රටේ

3 වන පිටුවට

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්වයන් නොසලකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**හඬ සඟරාව උපදේශක මණ්ඩලය**

K. D පීරිස් මහතා
වජිර උමගලිය මහතා
සුභද්‍රා රාජසිංහ මහත්මිය
ලූර්දු සාමි මහතා

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැවීමට අපේක්ෂා කරනු ලබයි. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධවීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධාන වලට/පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකත්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතුවේ

- අධ්‍යාපනය සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් වැඩකරන පළපුරුදු සංවිධානයක් හෝ පුද්ගලයෙක් විය යුතුය
- සංවිධානයක් නම් රජයේ අදාළ ආයතනයන්හි (දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම්/සමාජ සේවා අමාත්‍යාංශය) ලියාපදිංචි වී තිබිය යුතුය

අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර දුරකතන අංක 0112887642 ඔස්සේ අප අමතන්න නැත්නම් අපට ලියන්න අපගේ ලිපිනය

**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අංක 439/6A**
**සුදර්ශන මාවත**
**නාවල පාර. රාජගිරිය**

## සංස්කාරක සටහන

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණු වල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන්ම අධ්‍යාපන සන්වර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සලකන්න.

# රූසෝ දරුවන්ට දඬුවම් කළ හැටි

අධ්‍යාපන මෙන්ම දේශපාලන දාර්ශනිකයෙකු වූ ප්‍රංශ ජාතික ජීන් ජැක්වීන් රූසෝ ගත් කතුවරයෙකු ද විය. "එමිල්" යනු ඔහු විසින් රචිත එක් අධ්‍යාපනය සම්බන්ධ ග්‍රන්ථයකි. එමිල් ඔහුගේ පුතාගේ නම වූ අතර එම ග්‍රන්ථයේ අන්තර්ගතය වන්නේ තම පුත්‍රයාගේ චරිතය හා හැසිරීම් රටාව පදනම් කරගෙන ඒ ඔස්සේ අධ්‍යාපනයේ දාර්ශනික කරුණු සාකච්ඡාවට භාජනය කිරීමයි.

එම ග්‍රන්ථයේ එක් දාර්ශනික කරුණක් සඳහන් කරන්නේ තම පුතා වූ එමිල් විසින් සිදු කළ වරදකට රූසෝ විසින් දඬුවම් දුන් ආකාරය විස්තර කරමිනි.

එමිල් දඟකාර දරුවෙකු විය. එමෙන්ම ක්‍රියාශීලිය. ක්‍රීඩාවට ලැදිය. දිනක් ඔහු මිදුලේ සෙල්ලම් කරමින් සිටියේය. ඔහුගේ දඟකාරකම නිසාම ඔහු ගැසූ බෝල පහරක් හේතුවෙන් තම නිවසේ ජනේලයක වටිනා වීදුරුවක් බිඳ වැටුණි. තමා කළ වරදෙහි බරපතලකම වෙනුවෙන් තම පියා නිවසට පැමිණි පසු ඔහුට දෙන දඬුවම පිළිබඳ එමිල් කල්පනා කරමින් සිටියේය.

සවස් භාගය වන විට තම පියා නිවසට පැමිණියේය. ජනෙල් වීදුරුව බිඳී ඇති බවත් එය සිදු වී ඇත්තේ තම පුතා විසින් ගැසූ බෝල පහරක් නිසා බවත් රූසෝට දැන ගන්නට ලැබුණි. ටික වේලාවක් ගත වුව ද ඒ පිළිබඳව රූසෝ කිසියම් ක්‍රියාමාර්ගයක් ගනු දක්නට නොලැබුණි. පියා දරුවාට දඬුවම් නොකිරීම ගැනත් ඔහුගේ නිහැඬියාව ගැනත් එමිල් තුෂ්ණිම්භූතව බලා සිටියේය.

එදින රාත්‍රී කාලය එළැඹුණි. රාත්‍රී කෑම ගෙන අවසන් වූ පසු නිවසේ සියලු දෙනා නින්දට යන වේලාවේ දී රූසෝ තම පුත්‍ර එමිල්ට කතා කළේය.

"අද මම පුතාගේ නිදන කාමරය වෙනස් කරනවා. අද පුතා නිදා ගත යුත්තේ මෙතැනයි" යනුවෙන් අලුතින් සූදානම් කළ ඇඳක් එමිල්ට පෙන්නුම් කළේය. එම ඇඳ තබා තිබුණේ එමිල් අතින් බිඳී ගිය ජනේලය තිබූ ස්ථානයේ බිත්තිය අසලයි. එමිල් එදා නිදාගනු ලැබුවේ පියා විසින් සූදානම් කර දුන් අලුත් ඇඳ මතයි.

අලුතින් තනා දුන් ඇඳෙහි නින්දට යාම ගැන එමිල් සතුටට පත් විය. එසේ වුව ද මධ්‍යම රාත්‍රිය එළැඹෙන විට බිඳී ගිය ජනේලයෙන් ඇතුල්වන දැඩි සීතල සුළඟ සහ ඇදී ආ හිරිකඩ නිසා එමිල්ට නින්ද ගියේ නැත. බොහෝ වේලාවක් යනතුරු දැඩි අපහසුතාවයෙන් ඇඳෙහි ඒ මේ අතට පෙරළෙමින් සිටි එමිල්ට යමක් අවබෝධ විය. එනම් තමා අතින් දහවල් සිදු වූ වරදට තම පියා දුන් නිශ්ශබ්ද දඬුවම විඳින්නට සිදු වූ බව මෙන්ම මින් ඉදිරියට තවත් එවැනි වැරදි සිදු නොවන්නට වගබලා ගන්නා බවත් ය.

ඩබ් විජේවන්ත වෙල්ලාල
(BA, DipEd, MA in Edu.)
කොළඹ විශ්වවිද්‍යාලය
ලේකම්, අධ්‍යාපන සංවර්ධන සන්ධානය

1 වන පිටුවෙන්

දක්නට ලැබුනේ ද යන්න පිළිබඳ ගැටලු සහගතය. උදාහරණ වශයෙන් රත්නපුර නගරය ආශ්‍රිත ප්‍රදේශයේ ඇතිවූ තත්වය සැලකිල්ලට ගත හැකියි. නිරිතදිග මෝසම් වැසි සක්‍රිය වන කාලසීමාවේ මෙම නගරයට ජලගැලීම් තර්ජනයක් ඇතිවන බව වසර ගණනාවක අත්දැකීම් තිබේ. එසේ නමුත් මෙවර ඇතිවූ ජලගැලීම් තත්වයන් හමුවේද අදාළ ප්‍රදේශය මහත් ආපදාවකට ලක්විණි. ආපදා සඳහා පෙර සූදානම් වීමේ යාන්ත්‍රණයේ පැහැදිලි දුර්වලතා නිරීක්ෂණය කළ හැකිවිය. මෙහිදී බොහෝවිට දක්නට ලැබුණේ විධිමත් ආපදා කළමනාකරණ උපක්‍රමයන් භාවිතා කිරීම නොව නිසි සම්බන්ධිකරණයකින් තොරව හදිසියේ සිදුකරන ලද ආපදා සහන සැලසීමේ ක්‍රියාමාර්ගයන්ය. මෙම තත්වය හේතු කොටගෙන සමහර ප්‍රදේශවලට අවශ්‍ය ප්‍රමාණයට වඩා සහනාධාර හා පහසුකම් ලැබීමත් තවත් ප්‍රදේශවල වැසියන්ට බලවත් අපහසුතාවන්ට ලක්වන්නටත් සිදුවිය. කෙසේ වෙතත් ආපදා කළමණාකරණය යන්න රජය හෝ රජයේ එක් ආයතනයක් විසින් තනිවම ක්‍රියාත්මක කළ හැකි කාර්යයක් නොවන අතර මේ සඳහා සියලු අංශයන්හි මනා සම්බන්ධිකරණයක් පැවැතිය යුතුය. ආපදා කළමනාකරණයේදී පෙර සූදානම් වීම ඉතා වැදගත්වන අතර මේ සඳහා ජනතාව දැනුම්වත් කිරීමේ ක්‍රියාවලියේදී අධ්‍යාපන ක්ෂේත්‍රයට වැදගත් මෙහෙවරක් ඉටු කළ හැකිය. කෙසේවෙතත් මෙම වැදගත් කාර්යයභාරය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් මේ තාක් යොමුවී නොමැත. මෙයට හේතුපාදක වූ විවිධ වූ කරුණු අතර ප්‍රධාන වශයෙන්

1. ආපදාවන් කලාතුරකින් සිදුවන ඒවා ලෙස සැලකීම
2. ඒවා විවිධ ස්වභාවයක් ගැනීම හා
3. විවිධ කරුණු මත ඇතිවීමත් එමගින් විවිධ ප්‍රතිඵල ගෙනදීමත් යන කරුණු මත ආපදාවන් සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග නිශ්චිත ඒවා විය නොහැක යැයි නිගමනය කිරීම දැක්විය හැකියි.

ආපදා කළමනාකරණ පිළිබඳව ජනතාව දැනුම්වත් කිරීමේදී විධිමත් අධ්‍යාපනය මෙන්ම අවිධිමත් අධ්‍යාපනය යන දෙඅංශයම වැදගත්වේ. උදාහරණ වශයෙන් ස්වභාවික ආපදාවක් සිදුවීමේ ගති ලක්ෂණ හඳුනාගැනීමට පරිසර අධ්‍යයනය,භූගෝලීය විද්‍යාව පිළිබඳව පාසලෙන් ලබන්නා වූ විධිමත් අධ්‍යාපනයෙන් ලබාගන්නා දැනුම තුළිනුත් පාරම්පරික දැනුම සහ අත්දැකීම් ඇසුරින් ලබන්නා වූ පාරිභාෂික ඥාන සම්භාරය තුලින් ද සිදුකළ හැකිය.

**ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යාපනයෙන් සිදුකළ හැකි බලපෑම විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට පමණක් සීමාවූවක් නොවේ. එදිනෙදා ජීවිතයේ යහභාවිතාවන් සම්බන්ධයෙන් ජනසමාජය පාරම්පරිකව අත්දැකීම් තුලින් ලබාගෙන තිබෙන දැනුම් සම්භාරය ආපදා කළමනාකරණයේ දී යොදාගත හැකිවේ.**

මෙම ලිපියේ අරමුණ වන්නේ ආපදා අවමකරලීම සඳහා අධ්‍යාපන අංශයේ කාර්යයභාරය හා දායකත්වය පිළිබඳව සාකච්ඡා කිරීමයි.

ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් අධ්‍යාපනයේ ප්‍රධානතම ආයතනය ව්‍යුහය වශයෙන් සැලකිය හැකි පාසල් පද්ධතිය මගින් වැදගත් මෙහෙවරක් ඉටුකරගත හැකිය. ආපදාවන් සම්බන්ධයෙන් ප්‍රජාමට්ටමින් තොරතුරු සෘජුව හා ඉක්මනින් ලබාගැනීමටත් එසේම තොරතුරු බෙදාහැරීමටත් පාසල් පද්ධතිය කාර්යක්ෂමව යොදාගත හැකිය. පාසල් විෂයය මාලාව මගින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් ස්වභාවික ආපදාවන් අවම කිරීම සම්බන්ධයෙන් ඵලදායී ක්‍රියාමාර්ගයක් වන්නේ එමගින් ඔවුන් ලබාගන්නා දැනුම ඔවුන්ගේ පවුල් වෙතද ව්‍යාප්ත වීම නිසාය.

පාසල් විෂයය මාලාවට ආපදා පෙරසූදානම් වීම පිළිබඳ පාඨමාලා කරුණු ඇතුළත් කිරීම ආපදා කළමනාකරණය සඳහා රටවල් බොහොමයක් විසින් අනුගමනය කරනු ලබන ඵලදායී ක්‍රියාමාර්ගයකි. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අමාත්‍යාංශයද 2004 වසරේ ඇතිවූ සුනාමි ආපදාවට පසුව ආපදාවන් සඳහා පෙරසූදානම්වීම පිළිබඳව පාසල් විෂයය මාලාවට ඇතුළත් කිරීමට පියවරගන්නා ලදී. මීට අමතරව දීර්ඝකාලීන භෞතික විසඳුම් වශයෙන් පාසල් පරිශ්‍රයන් ආපදා තත්වයන්ට ඔරොත්තුදීමට සූදානම් කිරීම සඳහා පියවර ගණනාවක් ගන්නා ලදී. මේවාට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ස්ථාන තෝරාගැනීමේදී ආපදාවන්ට ලක්විය හැකි ස්ථාන පිළිබඳව සැලකිලිමත්වීම හා ආපදාවන්ට ඔරොත්තු දෙන පරිදි ගොඩනැගිලි ඉදිකිරීම් සිදුකිරීම පිළිබඳ විධිවිධාන පැනවීම මෙන්ම ආපදාවන් ඇතිවුන අවස්ථාවලදී රැස්විය යුතු ස්ථාන එවැනි අවස්ථාවන්හි දී අනුගමනය කළ යුතු කරුණු වැනි වැදගත් මාර්ගෝපදේශ සැකසීමද ඇතුළත් විණි. කෙසේවෙතත් ඉන් අනතුරුව මෙම කරුණු පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන ලද අවස්ථා නිරීක්ෂණය කළ හැකිය.

ආපදා තත්වයන් හිදී බොහෝ විට ළමුන් සහ කාන්තාවන් වැඩි වශයෙන් ආපදාවන්ට ගොදුරුවීමේ අවදානමක් ඇති කොටසක් ලෙස සැලකේ. මෙම තත්වයන් නිසා ආපදා තත්වයන් හමුවේ පළමුවෙන් සොයාබැලීමට ලක්වන්නේ සහ මුදාගැනීමේ ක්‍රියාවන්හි දී මූලිකත්වය ලබාදෙන්නේ ළමුන් සහ කාන්තාවන්ටය. එසේ නමුත් ළමුන්ට සහ කාන්තාවන්ට ආපදා තත්වයන් පිළිබඳව දැනුම්වත් කරමින් ජනතාව එවැනි තත්වයන් පිළිබඳව අවධියෙන් තැබීමට වැදගත් කාර්යයභාරයක් ඉටුකළ හැකිය. ස්වභාවික ආපදාවන් සම්බන්ධයෙන් ළමුන් පාසල් අධ්‍යාපනයේදී ප්‍රමාණවත් දැනුමක් ලබා තිබෙන අවස්ථාවන්හි දී තමන් අපදාවන්ගෙන් බේරී සිටීමට සහ අනෙක් අය දැනුම්වත්කර ඔවුන් මුදවා ගැනීමටද ක්‍රියාකළ හැකි බව පෙනී ගොස් ඇත. මේ සම්බන්ධයෙන් වන කදිම උදාහරණයක් 2004 වසරේදී ඇතිවූ සුනාමි ආපදාව අවස්ථාවේදී තායිලන්තයේ වාර්තා විණි. දස හැවිරිදි බ්‍රිතාන්‍ය ජාතික දැරියක් තම දෙමාපියන්ද සමගින් 2004 වසරේ තායිලන්තයේ වෙරළ ආශ්‍රිත ප්‍රදේශයක සංචාරය කරමින් සිටියාය. සුනාමි තත්වයකදී ඇතිවිය හැකි ස්වභාවික ලක්ෂණ පිළිබඳව මෙයට සතියකට පෙර පාසලේ දී භූගෝලය විෂයය යටතේ යම් දැනුමක් ලබාගෙන සිටි ඇය පරිසරයේ තත්වයන් නිරීක්ෂණය කරමින් සුනාමියක් පැමිණෙන බවට අවට සිටි පිරිස දැනුම්වත් කිරීමට පියවර ගත්තාය. ඇයගේ මෙම ක්‍රියාව නිසා සංචාරකයින් 100 දෙනෙකුට පමණ තම ජීවිත බේරා ගැනීමට හැකිවිය.[1] ආපදාවන් සඳහා පෙර සූදානම්වීම හා ආපදා කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම නියමිත පාසල් විෂයයමාලාව මගින් මෙන්ම වැඩමුලු කණ්ඩායම් ක්‍රියාකාරකම් හා ක්‍රීඩා වැනි විෂයය බාහිර ක්‍රියාකාරකම් මගින්ද සමන්විත වූවක් විය හැකිය. මෙවැනි ආකාරයේ සංකලනයක් තුලින් වඩාත් ඵලදායී ප්‍රතිඵල ලඟාකරගත

1 126UN/ISDR.: World disaster reduction campaign. Disaster risk reduction begins at school. Available at http://www.unisdr.org/eng/public_aware/world_camp/2006-2007/pdf/WDRC- 2006-2007-English-fullversion.pdf,2006 (Accessed on January 10.04. 2013).

හැකිවනු ඇත. වර්තමානයේ දක්නට ලැබෙන ආපදාතත්වයන් ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් මිනිස් ක්‍රියාකාරිත්වයන් නිසා ඇති වන බැවින් පරිසර සාධක තිරසර අන්දමින් තමන්ට හිතකාමී අන්දමට සකසා ගැනීමටත් අනතුරුවලින් මගහරිමින් කටයුතු කිරීමට පුද්ගලයා හැඩගැස්වීමටත් පාසල් අධ්‍යාපනය යොදාගත හැකියි. ස්වභාවික ආපදා සියල්ල අපට නැවැත්විය නොහැකි නමුත් ඒ පිළිබඳව දැනුම්වත් වෙමින් ඒවා වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රජාව සවිබල ගැන්වීමට මූලික අධ්‍යාපනය යොදාගත හැකි බැවින් මතු අනාගතයේ ඇති විය හැකි අපදා අවදානම් අවමකරලීම සඳහාද පාසල් අධ්‍යාපනය ඵලදායීව යොදාගත හැකි බව පැහැදිලිවේ.

ආපදා අවදානම් අවම කරලීම සඳහා පාසල් මෙන්ම මීට වඩා වෙනත් මානයකින් උසස් අධ්‍යාපන ආයතන සම්බන්ධ කරගත හැකිවේ. ආපදාවන් සඳහා පෙරසූදානම්වීම ආපදා අවම කිරීම හා කලමනාකරණය පිළිබඳව සිද්ධාන්ත හා ප්‍රායෝගික පාඨමාලාවන් ආරම්භ කිරීමට හා ඒ සම්බන්ධව විද්‍යාත්මක පර්යේෂණ සිදුකිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතනවලට විධිමත් මෙහෙවරක් සිදුකළ හැකිවේ.

ආපදා කළමනාකරණය යනු විද්‍යා විෂයයට පමණක් සීමා වූ විෂයය ක්ෂේත්‍රයක් නොවේ. මේ අනුව භූගෝලය, පරිසර විද්‍යාව, සමාජවිද්‍යාව, මනෝවිද්‍යාව, වෛද්‍ය විද්‍යාව, සිවිල් ඉංජිනේරු, සැලසුම්කරණය, වාස්තු විද්‍යාව හා කෘෂිකර්මය ආදී විෂයය දහරාවන්ට ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිළිබඳව වැදගත් දායකත්වයන් සැපයිය හැකියි. පාසල් අධ්‍යාපනයේදී මෙන් නොව අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීමටත් අන්තර්ජාතික මට්ටමේ දැනුම ගවේෂණය හා පර්යේෂණ වල නිරතවෙමින් ආපදා කළමනාකරණය සඳහා කෙටිකාලීන හා දීර්ඝ කාලීන විසඳුම් සොයා ගැනීමේ ක්‍රියාවලියට උසස් අධ්‍යාපන ආයතනවල දායකත්වය ලබාගැනීම හැකිවේ.

ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් අධ්‍යාපනයෙන් සිදුකළ හැකි බලපෑම විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට පමණක් සීමාවූවක් නොවේ. එදිනෙදා ජීවිතයේ යහභාවිතාවන් සම්බන්ධයෙන් ජනසමාජය පාරම්පරිකව අත්දැකීම් තුලින් ලබාගෙන තිබෙන දැනුම් සම්භාරය ආපදා කළමනාකරණයේ දී යොදාගත හැකිවේ. ආපදා සඳහා පෙර සුදානම්වීමට ස්වභාවික විපත් කලින් හඳුන්වාගැනීමේ තාක්ෂණයන් පැරණි ජනසමාජයේ දක්නට ලැබිණි. පරිසරයේ ඇතිවන ගතිලක්ෂණවල

**වැහිලිහිණියන් අහසේ පියාසර කරන රටාව නිරීක්ෂණය කරමින් වර්ෂාව ඇතිවන බව පුරෝකථනය කිරීම, ගවයන් කෑගැසීමේ සුවිශේෂී තත්වයන් නිරීක්ෂණය කරමින් ගංවතුර තත්වයන් ඇතිවිය හැකිබවටත් පූර්ව නිගමනවලට එළැඹීමට ඔවුන් සමත්වූහ.**

වෙනස්කම් මෙන්ම ගෘහාශ්‍රිත සත්වයින්ගේ හැසිරීම් වල වෙනස්කම් නිරීක්ෂණය කරමින් මෙම තත්වයන් පිළිබඳව අවබෝධ කරගැනීමට ඔවුන් සමත්වූහ. පරිසරය හා සංවේදීභාවයෙන් කටයුතු කිරීම තුලින් පරිසරයෙන් හා ස්වභාවික සිදුවීම් මත සිදුවන්නාවූ අපදාවන්හි බලපෑම යම්තාක් දුරකට අවම කරගත හැකිබව අපගේ ජනසමාජය ඇසුරින් නිරීක්ෂණය කළ හැකිය.

වැහිලිහිණියන් අහසේ පියාසර කරන රටාව නිරීක්ෂණය කරමින් වර්ෂාව ඇතිවන බව පුරෝකථනය කිරීම, ගවයන් කෑගැසීමේ සුවිශේෂී තත්වයන් නිරීක්ෂණය කරමින් ගංවතුර තත්වයන් ඇතිවිය හැකි බවටත් පූර්ව නිගමනවලට එළැඹීමට ඔවුන් සමත්වූහ. පරිසර තත්වයන් නිරීක්ෂණය කරමින් නියඟ තත්වයන්ට ගැලපෙන පරිදි වගාක්‍රම සහ භෝග වර්ග තෝරාගැනීමට ගොවීන් සමත්වූහ. වර්තමානයේ ළමුන් තම විධිමත් පාසල් අධ්‍යාපනය පිළිබඳව පමණක් අවධානය යොමු කිරීමත් පරිසරය හා සංවේදී නොවීමත් හේතු කොටගෙන ඉතා පහසුවෙන් ලබාගැනීමට හැකි දැනුම් සම්භාරයක් ඔවුන්ගෙන් ගිලිහී යන අයුරු පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය.

ආපදා කළමනාකරණයේදී සමාජ ප්‍රාග්ධනය එනම් සමාජය පාරම්පරිකව ගොඩනගාගත් දැනුම කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් භාවිතා කළ හැකියි. මේ සඳහා සමාජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රජා කළමනාකරණ උපක්‍රම හඳුනාගැනීමත් ඒවාට දිරිදීමත් සිදුකළ යුතුය. ජලගැලීම් තත්වයන් ඇතිවූ වහාම ආහාර අහේනියක් ඇතිවීම, බාහිර ප්‍රදේශවලින් සහනාධාර සැපයීමට සිදුවීම සහ ඒවා මත සම්පූර්ණයෙන් යැපීමට සිදුවීම මෙම ප්‍රජා කළමනාකරණ උපක්‍රම සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොකිරීම මත ඇතිවී තිබෙන තත්වයන් ලෙස හැඳින්විය හැකියි. වැඩි වර්ෂාපතනයක් ඇතිවන කාලසීමාවන්, ගංවතුර ඇතිවීමේ පූර්ව ලක්ෂණ වැනි තත්වයන් පිළිබඳව කල්තියා හඳුනා ගැනීමේ සහ ඒවාට සූදානම් වීමේ පරිචයක් පැරැන්නන් තුළ දක්නට හැකිවිය. අදාළ කාලයේදී ප්‍රයෝජනයට ගත හැකි පරිදි පවුලේ සාමාජිකයන්ට ප්‍රමාණවත් වන කල්තබා ගත හැකි ආහාර රැස්කර තබාගැනීමට කටයුතු කිරීමේ පුරුද්දක් පැරණි ජනසමාජයේ දක්නට ලැබිණි. එසේම ජලගැලීම්වලින් විනාශයට පත්විය හැකි දේපළ බඩුභාණ්ඩ ආරක්ෂාකාරී ස්ථානවලට ගෙන යාම වැනි ආපදා පෙරසූදානම් වීම අනුගමනය කරන ලදී. එපමණක් නොව ජලගැලීම් නිසා ඇතිවන ප්‍රතිවිපාක ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් අන්දමින් භාවිතා කළ අවස්ථාද දක්නට හැකිය. උදාහරණ වශයෙන් ගංවතුර ඇතිවූ ස්ථානයන්හි තැන්පත් වන මැටිවලින් ගඩොල් කර්මාන්තය සඳහා උපයෝගී කරගැනීම ගංගා ජලය මගින් ගෙන එනු ලබන ඓන්ද්‍රිය ද්‍රව්‍යවලින් සරුසාර මැටි, පස් රැඳුනු ප්‍රදේශ වගාවන් සඳහා යොදාගැනීම සැලකිය හැකියි.

පුද්ගලයින් නොයෙකුත් සිද්ධීන්වලට මීට පෙර මුහුණදීමෙන් ලබාගත් දැනුම සහ අත්දැකීම් තුලින් පවුල් සහ ප්‍රජාවන් ස්වභාවික ආපදාවලට ඔරොත්තුදීමේ හැකියාව ලබාගෙන තිබේ. අතීතයේ පවුලේ සාමාජිකයින්ගේ කාර්යයභාරය අදට වඩා වෙනස්වූ අතර ස්වභාවික ආපදාවන් පිළිබඳව එකිනෙකා හා තොරතුරු හුවමාරු කරගැනීමට ඔවුන්ට කාලවේලාව තිබිණි. මෙමගින් එවැනි අවස්ථාවන් සඳහා වඩාත් හොඳින් සූදානම්වීමට ඔවුන්ට හැකිවිය. හුදෙකලා වූ ජීවිතයක් ගත කිරීම වෙනුවට සමාජ ක්‍රියාකාරකම් හා ප්‍රජා කටයුතුවලට මැදිහත්වී නියැලී සිටීම මගින් තම පවුලේ සාමාජිකයින් සමගින් පමණක් නොව බාහිර වැඩිහිටි පුද්ගලයින් සමගද සම්බන්ධවී දැනුම හුවමාරු කරගැනීමේ අවස්ථාව උදාවන අතර මෙමගින් ජනතාවට වඩාත් සාර්ථකව ආපදාවන්ට මුහුණුදීමටත් හැකිවනු ඇත. මේ අනුව විධිමත් සහ අවිධිමත් ආකාරයෙන් ලබාගන්නා අධ්‍යාපනය තුලින් ස්වභාවික ආපදාවන්හිදී ජනතාවගේ ඔරොත්තුදීමේ ශක්තිය වර්ධනය කිරීමට හැකිවන අතර මෙමගින් අවදානම අවම කරලීමට හැකිවන බව පෙනීයයි.

තිරසර සංවර්ධන අරමුණු අංක 04 යටතේ දැක්වෙන සියලුදෙනා අන්තර්කරණයවූ සමානත්වයෙන් යුත් ගුණාත්මක අධ්‍යාපන අවස්ථාවන් අඛණ්ඩව ලබාගැනීමට

**6 වන පිටුවට**

# අධ්‍යාපන අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමේදී සිවිල් ක්‍රියාකාරීන්ගේ කාර්යභාරය

අධ්‍යාපන අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේදී සිවිල් ක්‍රියාකාරීන්ගේ කාර්යභාරය පිළිබඳ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන නියෝජිතයින් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පසුගියදා කොළඹ, දකුණු ආසියා සහයෝගිතා ආයතනයේදී පැවැත්විණි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ පත්කළ ජාතික කමිටුවේ හිටපු සාමාජිකයෙකුවූ නිතිඥ සමරසිංහ ගුණසේකර සහ ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝශප් ස්ටාලින් යන මහත්වරු සම්පත්දායකයින් ලෙස සහභාගී වූ මෙම වැඩසටහනේදී අධ්‍යාපන අයිතිවාසිකම් හා එම අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට අදාළව අවධානය යොමුකළ හැකි ප්‍රමුඛ කාරණා රැසක් පිළිබඳව සාකච්ඡාවට ලක්වූ අතර එම ගැටලු ජයගැනීමේ ක්‍රමෝපායයන් පිළිබඳව විශේෂ කණ්ඩායම් සාකච්ඡා කිහිපයක් ද එහිදී සිදුකෙරිණි.

මේ, එම වැඩමුළුවේදී සම්පත්දායකයින් ඉදිරිපත්කළ අදහස් සහ ගැටලු ජයගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව සිවිල් ක්‍රියාකාරීන් ඉදිරිපත්කළ යෝජනා පිළිබඳ කෙටි සටහනකි.

අධ්‍යාපනයට පනතක් නොමැති වීම ඉතාම අවාසනාවන්ත තත්ත්වයක් !

**- නිතිඥ සමරසිංහ ගුණසේකර**

"තවමත් අපට අධ්‍යාපනය සම්බන්ධයෙන් පනතක් නෑ. මීට අවුරුදු 70 කටත් කලින් 1939 දී පනවපු අධ්‍යාපන ආඥා පනත තමයිඃ අධ්‍යාපනය සම්බන්ධයෙන් කිසියම් විග්‍රහයක් කරන්න ඕන වුණාම අපි තවමත් පාවිච්චි කරන්නේ. මේ ආඥා පනත වෙනස් කරන්න විවිධ උත්සාහයන් කිහිපයක්ම ක්‍රියාත්මකවුණා. ජාතික අධ්‍යාපන ආයතනයේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් ජී.බී. ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් අධ්‍යාපන කොමිටියක් දාලා ඉතාම ප්‍රගතිශීලී, එසේම පරිපූර්ණ කෙටුම්පතක් හැදුවා.ඒ ගැන පාර්ලිමේන්තු මන්ත්‍රී කමිටුවක් සමගත් අප දීර්ඝ කාලයක් වැඩ කළා. මමත් ඒ ප්‍රතිසංස්කරණ කමිටුවේ හිටපු සාමාජිකයෙක්. ඒත් එය පනතක් බවට පත්වුණේ නෑ. එය රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්"

"ආගම මුල්කරගත් පාසල් ලංකාවේ අධ්‍යාපනයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්. ඒ ළමයි දන්නේ එක ආගමක් ගැන විතරයි. අනෙක් ආගම් ගැන ඔවුන් කිසිවක්ම දන්නේ නෑ. ඔවුන් හිතන්න පුරුදුවෙන්නේ ආගම මුල්කරගෙන. ඒක හරිම බරපතල දෙයක්.

"තවමත් අපට අධ්‍යාපනය සම්බන්ධයෙන් පනතක් නෑ. මීට අවුරුදු 70කටත් කලින් 1939 දී පනවපු අධ්‍යාපන ආඥා පනත තමයිඃඅධ්‍යාපනය සම්බන්ධයෙන් කිසියම් විග්‍රහයක් කරන්න ඕන වුණාම අපි තවමත් පාවිච්චි කරන්නේ.

අපේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සරලව කියනවානම් මේ ඉගෙන ගන්න දේ විකුණගෙන කන්න පුළුවන්ද කියන ප්‍රශ්නය ගැන දැඩි අවධානයක් යොමු වියයුතු වෙනවා. ඒ වගේම ප්‍රාථමික පාසල් වෙනම පවත්වාගෙන යාමේ යෝජනාව වගේ කරුණු රැසක් පිළිබඳව එම පනතට ඇතුළත් වුණා.

"අධ්‍යාපනය කියන්නේ විභාග පාස්කරන එක විතරක් නෙවෙයි. එය පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධයි. පැරණි යුනිසෙෆ් වාර්තාවක අධ්‍යාපනය හා ළදරු මරණ අනුපාතය අතර සම්බන්ධය විස්තරකර තිබෙනවා. එම වාර්තාව මගින් සාකච්ඡා කරන්නේ වතුකරයේ අම්මා කෙනෙකුට ළමයෙක් ලැබිලා අවුරුද්දක් ඇතුළත මියයාම සහ අම්මාගේ අධ්‍යාපනය අතර ඇති සම්බන්ධය ගැන. ඒ අම්මා උසස් පෙළ සමත් නම් ළදරු මරණ අනුපාතිකය 0 යි. කවදාවත් ඉස්කෝලේ ගිහින් නැත්නම් එම මරණ අනුපාතය ගොඩක් ඉහළයි. අම්මා 8 පාස්නම්, 10 පාස්නම් ආදී වශයෙන් අම්මාගේ අධ්‍යාපනයේ මට්ටම අනුව මරණ අනුපාතයේ පැහැදිලි වෙනස්කමක් දක්නට ලැබෙනවා. මේක අධ්‍යාපනයට සම්බන්ධ කාරණයක්. අම්මා ඉගෙනගෙන තිබෙනවානම් දරුවාගේ ජීවත්වීමේ අයිතිය සුරක්ෂිත වෙනවා. අධ්‍යාපනය කියන්නේ ඉතාම විශිෂ්ට දෙයක්."

"අපි ළමයින්ගේ අධ්‍යාපන හිමිකම් රකින්නේ කොහොමද? ඉස්කෝලේ එන්නෙ නැති ළමයි පාසලට ගෙන්වා ගන්නේ කොහොමද? ඒ ළමයි පාසල් නොඑන හේතු මොනවාද? ආබාධිත ළමයින්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙන්නේ කොහොමද? මේ වගේ කාරණා ගැන අවධානය යොමු කිරීම ඉතාම වැදගත්. කොළඹ ආනන්ද විද්‍යාලයේ, නැත්නම් නාලන්ද විද්‍යාලයේ හෝ රාජකීය විද්‍යාලයේ ළමයි මග හැලෙනවද? ඒ කියන්නේ නාමලේඛනයේ නම තියෙනවා; ළමයා ඉස්කෝලෙ නොඑන තත්ත්වයක් තියෙනවද? එම විදුහල්වලට එවැනි ගැටලු නැහැ.

1939 අධ්‍යාපන ආඥා පනතේ ඉස්කෝලෙ එන්නෙ නැති ළමයි පාසලට ගෙන්වා ගැනීම සඳහා නඩු දැමීමට අවකාශ තිබුණා. ඒ විතරක් නෙවෙයි; ඔවුන් පාසලට නොඑන හේතු හඳුනාගෙන අවශ්‍යනම් ළමයින්ට ශිෂ්‍යත්ව ලබාදෙන්න හැකියාව තිබුණා. එම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ලෙස කන්නන්ගර සමයේ අධ්‍යාපනයේ විශාල දියුණුවක් ඇතිවුණා.

අද වනවිට අපේ අධ්‍යාපනයේ ප්‍රවේශය වැඩි වුණාට අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ ගැටලු රැසක් පවතිනවා. බොරැල්ලේ ඉස්කෝලේ ලබාදෙන අධ්‍යාපනයයි රාජකීය විද්‍යාලයේ ලබාදෙන අධ්‍යාපනයයි සමාන නැහැ. අධ්‍යාපන අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡා කරන විට මෙවැනි කාරණා රැසක් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවෙනවා."

"අධ්‍යාපනය ගොඩනැංවීමට නම් සමහර මාෆියා පරාජය කිරීම අත්‍යාවශ්‍යයි."

**- ලංකා ගුරු සංගමයේ ලේකම් ජෝශප් ස්ටාලින්**

අද අධ්‍යාපනය තුළ ළමයින්ගේ අයිතිවාසිකම්, අධ්‍යාපන ප්‍රතිපත්ති වගේ කාරණා ගැන පුළුල් සංවාදයක් දක්නට නැහැ. අද දෙමාපියන් වැඩිපිරිසක් අධ්‍යාපනයෙන් අපේක්ෂා කරන්නේ පළමු වසරේදී අත්පත් කරගැනීමට නොහැකිවූ පාසල ලබාගැනීම සඳහා ශිෂ්‍යත්ව විභාගය සමත්වීම, අ.පො.ස. සාමාන්‍ය පෙළ සමත්වීම සහ අ.පො.ස. උසස් පෙළ සමත්වීම පමණයි.මෙම මතවාදය අනෙක් පැත්තට හැරවීමත් පහසු දෙයක් නෙවෙයි. ලංකා ගුරු සංගමය ලෙස අප දීර්ඝ කාලයක් ඒ වෙනුවෙන් විවිධ උත්සාහයන් රැසක් දරා තිබෙනවා.

අද අධ්‍යාපනය තුළ විශාල තරගයක් නිර්මාණය වී තිබෙනවා. සමහර පාසැල් පටන්ගන්නේ උදේ 6.30 ට. අනෙක් පාසැලට වඩා තමන්ගේ පාසලේ ප්‍රතිඵල වැඩිකර ගැනීමට විදුහල්පතිවරු තරගෙට උදේ පාන්දරින් පාසලට ළමයි ගෙන්වනවා. පාසල් අතර විතරක් නෙවෙයි ;කලාප මට්ටමට ගියාම ඒවා අතරත් මේ තරගය තියෙනවා. කලාපයෙන් එහා

දිස්ත්‍රික් මට්ටමේදීත්, පළාත් මට්ටමේදීත් අධ්‍යාපනයේ සාර්ථකත්වය මැනෙන්නේ මුළුමනින්ම විභාග ප්‍රතිඵල මත.

අපේ කාලයේ ළමයි ඉගෙනගත්තේ සාමූහිකව. පාසැල් ආවේ නැති කෙනාට අනෙකාගේ පොත දෙනවා. බැරි දෙයක්නම් කියලා දෙනවා. විභාගෙදි වුණත් ඒ කාලේ උත්සාහ කළේ සියලුදෙනා සාමූහිකව සමත්වෙන්න. ඒත් අද ඒ තත්ත්වය මුළුමනින්ම වෙනස්. මේ තරගය තුළ ළමයි ඉතාම ආත්මාර්තකාමීයි. ගුරුවරු ඉඩ දුන්නත් අද ළමයි අනෙකාට පෙන්වන්නේ නෑ. උදව් කරන්නේ නෑ. එසේම මෙම තරගය නිසා බොහෝ පාසල්වල දුර්වල ළමයි අ.පො.ස. සා.පෙළ විභාගයට ඉදිරිපත් කරන්නේ නෑ. තමන්ගේ පාසලේ අ.පො.ස. සා.පෙළ ප්‍රතිඵල ප්‍රතිශතය අඩුවෙන නිසා. එවැනි තීරණයක් මගින් දරුවාට විභාග යට ඉදිරිපත් වෙන්න තිබෙන අයිතිය අහිමිවීමට වඩා විදුහල්පතිවරයාට පාසලේ ප්‍රතිඵල ප්‍රතිශතය රැකගැනීම වැදගත්. මේ තත්ත්වය තුළ ළමයා සහ ගුරුවරයා යන දෙදෙනාම දැඩි අපහසුතාවයකට පත්ව සිටිනවා. අධ්‍යාපනයේ ක්‍රියාත්මකභාවය ගැන අප සාකච්ඡා කළ යුත්තේ මෙම පසුබිම කෙරෙහි අවධානය යොමුකරමිනුයි.

මේ වනවිට ලංකාවේ සමස්ථ පාසල් සංඛ්‍යාව 10,162 ක්. ඒ අතරින් අ.පො.ස. උසස් පෙළ කලා, වාණිජ, විද්‍යා විෂයධාරා තුනම තිබෙන (1AB) පාසල් සංඛ්‍යාව 1,016 ක්. උසස් පෙළ කලා, වාණිජ විෂයධාරා දෙක පමණක් තිබෙන (1C) පාසල් සංඛ්‍යාව 1,805 ක්. ඒ අනුව 10,162 ක් වන සමස්ථ පාසල් පද්ධතියෙන් උසස් පෙළ විෂයධාරාව පවත්නා පාසල් තිබෙන්නේ 2,821 ක් පමණයි. ඉතිරි පාසල් 7,341 ම උසස් පෙළ නොමැති පාසැල්.

ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සැලකුවත් ළමයි 1000 කට වඩා සිටින පාසල් තිබෙන්නේ සමස්ථ පාසල් පද්ධතියෙන් 1000 කට අඩු ප්‍රමාණයක්. පාසල් 1455 ක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩුයි. ළමයි 51 - 100 අතර ප්‍රමාණයක් සිටින පාසල් සංඛ්‍යාව 1543 ක්. ළමයි 100 - 150 අතර ප්‍රමාණයක් සිටින පාසල් සංඛ්‍යාව 1176 ක්. අද අධ්‍යාපනය සම්බන්ධයෙන් සියලු තීන්දු තීරණ ගන්නේ ඉහතින් සඳහන් කළ පාසල් 1000 ක පමණ ප්‍රමාණය දිහා බලලයි. අපි

> **"ආගම මුල්කරගත් පාසල් ලංකාවේ අධ්‍යාපනයේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක්.ඒ ළමයි දන්නේ එක ආගමක් ගැන විතරයි. අනෙක් ආගම් ගැන ඔවුන් කිසිවක්ම දන්නේ නෑ. ඔවුන් හිතන්න පුරුදුවෙන්නේ ආගම මුල්කරගෙන.ඒක හරිම බරපතල දෙයක්.**

අත්‍යාවශ්‍යයෙන්ම කතාකළ යුතු මේ රටේ පීඩිත, අවාසි සහගත තත්ත්වයන් යටතේ ජීවත්වන අයගේ දරුවන් අධ්‍යාපනය ලබන මේ කුඩා පාසල් නොසලකා හැර තිබෙනවා.

ජාතික පාසල් සම්බන්ධයෙනුත් මේ තත්ත්වය අදාළයි. ලංකාවේ ජාතික පාසල් සංඛ්‍යාව 355 ක්. ඒත් පළමු වසරට සිසුන් ඇතුළත් කිරීමේ තරගය තියෙන්නේ අති ජනප්‍රිය පාසල් 36 ක පමණයි. උදාහරණයක් ලෙස කොටහේන, ආමර් වීදිය හන්දියේ තිබෙන කොටහේන ම.ම.වි ගත්තොත් එයත් ජාතික පාසලක්. ඊට ටිකක් උඩට ගියාම තවත් ජාතික පාසලක් වන මුස්ලිම් විද්‍යාලයක් තිබෙනවා. ඒත් මේ පාසල් දෙකටම ළමයි ඇතුළත් කරගැනීමේ තරගය අදාළ වෙන්නේ නැහැ. අති ජනප්‍රිය ජාතික පාසලක ගුරුවරයෙකු කිසියම් වංචාවකට දූෂණයකට හසුවෙලා ඔවුන්ට ස්ථාන මාරුවීමක් ලබාදෙන්න ඕන වුණාම මේ පාසැල් ජාතික පාසල් ලෙස සැළකෙනවා.

පසුගිය කාලයේ පාසල්වලට ළමුන් ඇතුළත් කිරීමට අදාළව නඩු කිහිපයක් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත්වී තිබුණා. හිටපු අගවිනිසුරු සරත් එන්. සිල්වා මහත්තය ඒ නඩු සියල්ල එකට අරගෙන ළමුන් ඇතුළත් කිරීම පිළිබඳ ප්‍රතිපත්තියක් හදන්න කියලා ජනාධිපති ලේකම් තුමාට නියමකළා. ජනාධිපති ලේකම් තුමා, උසාවි නියෝගය අනුව එම ප්‍රතිපත්තිය සැකසීමේ වගකීම ජාතික අධ්‍යාපන කොමිසමට භාරදුන්නා.ඒ අනුව එවකට ජාතික අධ්‍යාපන කොමිසමේ හිටපු ප්‍රධානී මහාචාර්ය ඒ.වී.සුරවීර මහත්මයා ඇතුළු පිරිසක් ඒ පිළිබඳ ප්‍රතිපත්තියක් හදල ජනාධිපති ලේකම් තුමාට භාරදුන්නා. ඒත් ඒ ප්‍රතිපත්තිය උසාවියට ඉදිරිපත්වුණේ නැහැ. ජනාධිපති ලේකම් තුමා උසාවියට භාරදුන්නේ වෙනත් ලියවිල්ලක්.ජාතික අධ්‍යාපන කොමිසම හදපු ප්‍රතිපත්තියේ මේ සියලු ජනප්‍රිය පාසල්වල 1-5 වසර ඉවත්කරලා ප්‍රාථමික පාසල් පද්ධතියක් සැකසීම ගැන පුළුල්ව සාකච්ඡාකර තිබුණා.රටේ වෙනසක් ඇතිකරන්න, අධ්‍යාපනයේ වෙනසක් ඇතිකරන්න ජනවාරි 08 වෙනස සමග ඉදිරිපත්කරපු දින 100 වැඩපිළිවෙලේ 58-62 දක්වා කරුණු මගින් මෙම ගැටලු වලට විසඳුම් සෙවීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් නව යෝජනා ඉදිරිපත්කර තිබෙනවා. ඒත් ඒ නිර්දේශ කිසිවක් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්න බැහැ. ඊට ප්‍රධානතම හේතුවක් තමයි ලංකාවේ පාසල් පද්ධතියේ පවතින ආදි ශිෂ්‍ය මාෆියාව.ජාතික අධ්‍යාපන කොමිසමට වඩා මේ මාෆියා ප්‍රබලයි.

අධ්‍යාපනයට අදාළව 2008/41 කියල චක්‍රලේඛයක් ක්‍රියාත්මක වෙනවා. ඒ චක්‍රලේඛය අනුව ආදි ශිෂ්‍යයින්ට වර්තමාන ශිෂ්‍යයින්ගෙන් මුදල් එකතුකරන්න බැහැ. ඒත් අද මොකද වෙන්නේ. පාසල් කීයක් විවිධ ගිණුම් කීයකට සිසුන්ගෙන් මුදල් එකතුකරනවද? සමහර ආදි ශිෂ්‍යයො රස්සාවක් කරන්නේ නෑ. උදේ ඉදල හවස් වෙනකම් පාසලේ නතරවෙලා ඉදගෙන විවිධ ව්‍යාපාරවල නිරතවෙනවා. මේක මාෆියාවක්.

මෙම සාකච්ඡා වලින් අනතුරුව අධ්‍යාපන සංවර්ධන සන්ධානය තම අභිදේශන ක්‍රියාකාරකම්වල දී ප්‍රමුඛස්ථානය ලබාදිය යුත්තේ කුමන අංශයන් පිළිබඳව ද යන්න සම්බන්ධයෙන් සාමාජික සංවිධානවල අදහස් ලබාගන්නා ලද අතර අධ්‍යපන සංවර්ධන සන්ධානයේ මූලිකත්වයෙන් සකස් කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පනත ක්‍රියාවට නැංවීමෙහිලා කටයුතු කළ යුතු බව බහුතරයකගේ මතය විය.

**ආනන්ද ජයසේකර**

---

**4 වන පිටුවෙන්**

අවස්ථාව සැලසීම යථාර්ථයක් කර ගැනීම සඳහා එයට සමගාමීව ක්‍රියාවට නැංවිය යුතු අනෙක් අරමුණු අතර ස්වභාව ධර්මය හා පරිසරය පිළිබඳව ඍජුවම සම්බන්ධවන අරමුණ අංක 13 කාළගුණික වෙනස්කම් සහ 15 ජෛව විවිධත්වය, වනගහණය සහ 12 වැනි අරමුණ තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය යන කරුණු සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කළ යුතුවේ. සියලු දෙනාට ආරක්ෂාකාරීව සුවපහසු ලෙස ජීවත්විය හැකි ලොවක් ගොඩනැංවීම සඳහා පරිසරය සුරකින පරිසර හිතකාමී ජනතාවක් බිහිකිරීමේ වැදගත්කම හමුවේ එයට අදාළ දැනුම් සම්භාරය ප්‍රේෂණය කිරීම සහ ආකල්ප සංවර්ධනය කළහැකි එකම මාධ්‍යය වන්නේ අධ්‍යාපනයයි.

මේ අනුව පාසල් විෂයය මාලාවට ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වන නවීනතම තාක්ෂණික කරුණු ඇතුළත් කිරීමටත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට අධීක්ෂණය කිරීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතුය. මෙහිදී උසස් අධ්‍යාපන ආයතනවල සහාය සහ සම්බන්ධීකරණය ලබා ගැනීමටත් එමෙන්ම සමාජ ප්‍රාග්ධනය තුළ ගැබ්ව පවතින ආපදා කළමනාකරණ දැනුම් සම්භාරය අපගේ නූතන පරපුරට ලබාගැනීමට හැකිවන ආකාරයටත් කටයුතු කිරීමත් ඔවුන්ගේ වගකීමයි.

**ශාන්ත කුලතුංග**

# ගුරුවරයෙකුට, පොතකට, පෑනකට මුළු ලෝකයක් වෙනස් කළ හැකිය

"අපේ පොත් තමයි බලගතුම ආයුධ. එක් ළමයෙකුට, එක් ගුරුවරයෙකුට, එක් පොතකට, පෑනකට ලෝකය වෙනස් කරන්නට පුළුවන්. අධ්‍යාපනය තමයි එකම විසඳුම. පළමුව අධ්‍යාපනයයි"
**මලාලා යුසුප්සායි**

රටක අධ්‍යාපනය යනු එම රටේ අනාගතය තීරණය කරන ප්‍රධාන සාධකය වුවද ලෝකයේ රටවල් 40% ක් තවමත් සිටින්නේ අධ්‍යාපනය පිළිබඳ තිරසර සංවර්ධන ඉලක්ක ජය ගන්නා තැනක නොවේ. දුප්පත්කම, සමානව නොසැළකීම ආදී කාරණා නිසා තවමත් පාසල් අධ්‍යාපනය අහිමි මිලියන සංඛ්‍යාත දරුවන් ලොව පුරා වෙසේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංඛ්‍යා ලේඛනවලට අනුව ලෝකයේ මිලියන 57 ක් වූ දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනය අහිමි වී ඇත. මේ අතර බහුතරයක් සිටින්නේ ත්‍රස්තවාදය සහ අන්තවාදී ක්‍රියාකාරකම් නිසා අධ්‍යාපන අවස්ථාවන් අහිමි වූ දරුවන්ය. පකිස්ථානයේ සහ ඇෆ්ගනිස්ථානයේ ත්‍රස්තවාදය සහ යුධ ගැටුම් නිසා දරුවන්ගේ පාසල් ගමන නතර කිරීමට සිදු වී ඇත. නයිජීරියාවේ අන්තවාදී බොකොහරාම් ත්‍රස්තවාදීන් දිගින් දිගටම ප්‍රහාර එල්ල කරනුයේ පාසල් සහ පාසල් ළමුන් ඉලක්ක කර ගෙනය. දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් ගෙනයන සටන ගෝලීය මට්ටමින් සිදුකළ යුත්තේ ඒ නිසාය.

ලෝක ඉතිහාසයේ ප්‍රථම වතාවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ලාබාලතම සාම දූතිකාව වීමේ භාග්‍යය පකිස්ථානයේ නොබෙල් සාම සම්මානලාභී මලාලා යුසුප්සායිට පසුගිය දා හිමි වූයේ අධ්‍යාපනය සඳහා ගැහැණු ළමයින්ට ඇති අයිතිය වෙනුවෙන් කළ කැපකිරීම හේතුවෙනි.

2008 වර්ෂයේ තලේබාන් සංවිධානය පකිස්ථානය තුළ බලය පතුරවමින් සිටි අතර කිසිම ගැහැණු ළමයෙකු පාසල් නොයා යුතුය යන නීතිය ගෙන එමින් 2009 වසරේ අන්තවාදීන් පකිස්ථානයේ කාන්තා පාසල් වසා දමන ලදි. එකොළොස් හැවිදිරි මලාලා, පොත්, පෑන්වලින් අන්තවාදීන් බිය ගැන්විය හැකිය යන සත්‍යය තේරුම් ගනිමින් කාන්තාවන්ගේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය වෙනුවෙන් දිගින් දිගටම සටන් කළාය. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 ඔක්තෝබර් 09 වන දින ඇය තලේබාන්වරුන්ගේ කුරිරු වෙඩි පහරකට ලක් විය. දැඩි අසාධ්‍ය තත්වයක පසු වුව ද කාන්තා අධ්‍යාපන අයිතිය වෙනුවෙන් ඇය කළ කැපකිරීම පරාජය කිරීමට නොහැකි වූ අන්තවාදීන් ඇයට ශ්‍රේෂ්ඨත්වයේ දොරටු විවර කර දුන්නේය.



මලාලා යුසුප්සායි

2013 ජූලි 12 වන දින එක්සත් ජාතීන්ගේ තරුණ සමුළුව අමතමින් මලාලා විසින් කළ දේශනය ලෝක නායකයන්ගේ අවධානය දිනා ගත්තාය.

"අන්තවාදීන් අධ්‍යාපනයට, පොත්වලට සහ පෑන්වලට බියක් දක්වයි. මිනිසුන් දැනුම අවබෝධය ලැබීම අන්තවාදීන් බියට පත් කරවයි. එසේම ඔවුන් කාන්තාවන්ට ද බිය වේ. ඒ ලොව පුරා නූගත්බවට, දිළිඳුබවට, ත්‍රස්තවාදයට එරෙහිව ඔවුන් නැගී සිටින බැවිනි. අපි අපේ පොත් පෑන් අතට ගනිමු. අපි සතු ප්‍රබලම අවිය වන්නේ ඒවාය. මන්ද ගුරුවරයෙකුට, පොතකට, පෑනකට මුළු ලෝකයක් වෙනස් කළ හැකිය"

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ගෝලීය අධ්‍යාපන සමුළුවේ ප්‍රථම සංවත්සරය අමතමින් ඇය තවදුරටත් ලෝක නායකයන්ගෙන් ඉල්ලා සිටියේ ත්‍රස්තවාදයෙන් පීඩා විඳින රටවල දරුවන්ට තුවක්කු, යුධ ටැංකි වෙනුවට පොත්පත්, පෑන් සහ ගුරුවරුන් එවන ලෙසයි. සියලු රටවල ආණ්ඩු සෑම ළමයෙකුටම නිදහස් අධ්‍යාපනය සඳහා ඇති අයිතිය සුරක්ෂිත කිරීමට කැපවිය යුතු බවයි. සංවර්ධනය වෙමින් පවතින රටවල ගැහැණු ළමයින්ගේ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා කටයුතු කළ යුතු බවයි.

කෙසේ නමුත් ළමා අධ්‍යාපනයට කළ විශිෂ්ට සේවය වෙනුවෙන් 2014 නොබෙල් සාම ත්‍යාගය පකිස්ථාන ජාතික මලාලා යුසුප්සායිට හිමි වන්නේ නොබෙල් ත්‍යාගය ලද ලාබාලතම දූරිය ලෙස ලෝක ඉතිහාසයට එක් වෙමිනි. නොබෝ දා එනම් 2017 අප්‍රේල් 10 වන දින ඇය සාම දූතිකාවක ලෙස නම් කරමින් එක්සත් ජාතීන්ගේ මහා ලේකම්වරයා ප්‍රකාශ කළේ මලාලා සැමට අධ්‍යාපනය යන සංකල්පයේ සංකේතයක් වන බවයි. සංවර්ධනය වන රටවල දරුවන්ගේ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා ඇය ගෙනයන ගෝලීය සටන සෙසු රටවල නායකයන්ට ආදර්ශයක් වන්නේ ඒ නිසාය. අධ්‍යාපනය පිළිබඳ තිරසර සංවර්ධන ඉලක්ක ජය ගන්නා සටන ආණ්ඩුවේ පමණක් නොව එය සියලු පුරවැසියන්ගේ වගකීම වන්නේය. මන්ද ගුරුවරයෙකුට, පොතකට, පෑනකට මුළු ලෝකයක් වෙනස් කළ හැකිය.

**දිනිති අලහප්පෙරුම**
**වැඩසටහන් සහකාරිනී**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

# පුරවැසි සමාජය අභියෝග ජය ගැනීමට තරම් පරිනතද ?

අද පුරවැසි සමාජය, සිවිල් සමාජය, පුරවැසි අයිතිවාසිකම්, සිවිල් අයිතිවාසිකම් පිළිබඳ ව බොහෝදෙනා කතා කරන බව අදහස් ඉදිරිපත් කරනු ලබන බව දක්නට ඇත. නමුත් පුරවැසි සමාජය ගැන කතා කරන විට ප්‍රධාන අභියෝග දෙකක් දැකිය හැකිය. එයින් පළමුවැන්න මෙම සංකල්පය අපැහැදිලි වීමයි. කොටින්ම ඒ පිළිබඳ පොදු පැහැදිලි එක් නිශ්චිත එකඟතාවයක් නොමැති වීමයි.

දෙවැන්න අවශ්‍ය නායකත්වය සැපයීමට නොහැකියාවයි. එඩිතර සිවිල් සමාජ ක්‍රියාකාරිත්වයකට හරස්ව සහ පළල්ව විශාල ඉල්ලුමක් තිබුනද එම අවශ්‍ය ඉල්ලුමට අවශ්‍ය නායකත්වය සැපයීමට සමාජයට හැකියාවක් නැත. එසේ නොමැති නම් ඒ ඉල්ලීමට සරිලන ප්‍රතිචාර දැක්වීමට ඉතාමත් දිගු කාලයක් ගැනීමක් ලෙස මෙය පැහැදිලි කළ හැකිය.

පුරවැසි සමාජයේ එසේ නොමැති නම් සිවිල් සමාජයේ සංවිධානයක් ලෙස පිළිගන්නට නම් එම සංවිධානය පහත සඳහන් තීර්ණායක පැහැදිලි ලෙස සම්පූර්ණ කොට තිබිය යුතුය.

- o පළමුවැන්න එයට පුරවැසි දැක්මක් තිබීමයි
- o දෙවැන්න එයට සදාචාරාත්මක අයිතියක්/ අධිකාරියක් තිබීමයි
- o තුන්වැන්න අතිශයින්ම ස්වාධීන ගතවීමේ ලක්ෂණයයි.
- o සිව්වැන්න පුරවැසියන් පෙළන ඕනෑම බලවේගයක් සමග අරගල කිරීමයි
- o පස්වැන්න විශ්වාසනීයත්වයයි

අද ක්‍රියාත්මක වන පුරවැසි සංවිධාන හෝ සිවිල් සමාජ සංවිධාන පෙර සඳහන් ආකාරයේ ඒවාදැයි අපි අපෙන්ම ප්‍රශ්න කර ගනිමු.

**කලාභූෂණ රාජ්‍ය සම්මානලාභී**
**කේ. ඩී. පීරිස්**



# ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය අධ්‍යාපනයේ නව ප්‍රවනතා

මිනිසාගේ ජීවිත කාලය තුළ ඉතාම සීඝ්‍ර වර්ධනයක් සිදුවන ඒ වාගේ ම අනාගතයට තීරණාත්මක බලපෑමක් සිදු කළ හැකි අවධියක් ලෙස "මුල් ළමාවිය" හඳුනා ගෙන ඇත. ළදරු අවධියේ වටිනාකම වටහාගෙන ඔවුන්ගේ පූර්ණ වර්ධනයක් ඇති කිරීම සඳහා ගත යුතු ක්‍රියා පිළිවෙත කෙරෙහි වඩාත් වැඩි අවධානයක් යොමු වූයේ ජීන් ජැක් වින්රූසෝ, කොමිනියස්, මාරියා මොන්ටිසෝරි වැනි දාර්ශනිකයන්ගේ හා අධ්‍යාපනඥයන්ගේ මත සමාජය තුළ ව්‍යාප්ත වීමත් සමග ය. අවුරුදු 05 දක්වා කාලය "මුල් ළමාවිය" ලෙසට අර්ථ ගන්වා ඇත. ඒ අනුව දරුවාගේ පූර්ණ විභවතාවයන් ස්ථාපිත වන මෙම කාල සීමාව මානවයාගේ සංවර්ධනයේ පදනම දැමෙන ස්වර්ණමය කාලය යි.

ශ්‍රී ලංකාව තුළ අද වන විට ඉතාම ජනප්‍රිය කතිකාවතක් සැකසී ඇත්තේ මුල් ළමා විය සංවර්ධනය පිළිබඳව ය. පෙර පාසල් වයස් සීමාව ලෙස සළකනු ලබන්නේ දරුවාට වයස අවුරුදු 02යි මාස 06 සිට අවුරුදු 05 අතර කාලය යි.

එදා එනම් 1920 වැනි කාලයේ දී ප්‍රධාන නගරවල පමණක් "මොන්ටිසෝරි" නමින් පෙර පාසල් කිහිපයක් තනි තනි පුද්ගලයින් විසින් පවත්වාගෙන යන ලදි. මෙය ක්‍රමයෙන් සෙමෙන් වර්ධනය වෙමින් 1960 - 1970 අතර කාලයේ තව දුරටත් ක්‍රියාත්මක විය. ජනතාව තුළ ද "මොන්ටිසෝරි" වචනය හා එහි ක්‍රියාදාමය පිළිබඳව පැවැතියේ සීමිත අවබෝධයකි.

1972 වසර වනතුරු මුල් ළමා විය අධ්‍යාපනය ගැන එතරම් උනන්දුවක් පොදුවේ රට තුළම නොවීය. 1972 දී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇති වූ වසරක් විය. එහි දී "දිවි පැවැත්මට ඉගෙනීමේ" වාර්තාව මගින් ඉතා වටිනා යෝජනාවක් එක් කරලීය. එනම් එහි දී දරුවෙකුට පාසල් අධ්‍යාපනය මෙන් ම පෙර පාසල් අධ්‍යාපනයක අවශ්‍යතාවය ද පෙන්වා දී ඇත. එහි තවත් යෝජනාවක් මගින් මුල් ළමාවිය අධ්‍යාපනයේ විශාල නැග්මක් රට තුළ ඇති විය. එය විධිමත් පාසලට දරුවන් ඇතුලු කර ගන්නා වයස් මට්ටම අවුරුදු 06 දක්වා දීර්ඝ කරන ලෙසට වූ යෝජනාව යි.

ඒ නිසා පෙර පාසල්වල අවශ්‍යතාවය වඩාත් වැඩියෙන් සමාජයට දැනෙන්නට විය. පෙර සඳහන් කළ පරිදි 1972 න් පසු මුල් ළමා විය අධ්‍යාපනයේ සීඝ්‍ර සංවර්ධනය ආරම්භ වූවා යැයි කීම යුක්ති සහගතය.

1972 වසරේ දී ග්‍රාමීය හා අර්ධ නාගරික ප්‍රදේශයන් හි අඩු ආදායම්ලාභී දරුවන් ඉලක්ක කරගෙන සර්වෝදය ආයතනය පෙරපාසල් පිහිටු වීම ආරම්භ කිරීම වඩාත් යහපත් ලක්ෂණයක් විය.

මෙයට ආසන්න කාලයේදී ම වතුකරයේ දරුවන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිහිටුවන ලදි. පසුව ඒවායේ ද පෙර පාසල් ආරම්භ කරන ලදි. තරුණ ක්‍රිස්තියානි සංගමය ද සමහර සේවක සංගම් ද මේ කටයුත්ත ආරම්භ කරන ලදි. එබැවින් මෙම අවධිය මුල් ළමාවිය අධ්‍යාපනයේ විකාශන අවධියක් බව පැවසීම වඩාත් සාධාරණය.

මුල් ළමාවිය අධ්‍යාපනයේ නව සංවර්ධනාත්මක ප්‍රවනතා රාශියක් 1978 සිට ඇති විය. ඒවා අතර,

- 1979 ජාත්‍යන්තර ළමා වර්ෂය ලෙස නම් කිරීම හා ළමා ලේකම් කාර්යයාලයක් ලංකාවේ පිහිටු වීම මගින් ළමුන්ගේ පූර්ව ළමාවියේ අධ්‍යාපනය ගැන වඩාත් වැඩියෙන් සාකච්ඡා විය.
- 1986 වසර රජය විසින් පෙර පාසල් අධ්‍යාපනයේ වටිනාකම හඳුනා ගත් සුවිශේෂී අවස්ථාවක් ලෙස දැක්විය හැකිය. එහි දී "මුල් ළමාවිය සත්කාරය සහ අධ්‍යාපනය" නම් වාර්තාව (Sessional Paper 111) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. ඒ වන විට අධ්‍යාපන බලධාරීන් වාර්තා කරනු ලැබුවේ පළමු වසරට ඇතුළත් වන දරුවන්ගේ ආරම්භක සූදානම බොහෝ දරුවන් තුළ පහළ මට්ටමක පවතින බවය.
- 1987 රට පුරා පළාත් සභා පිහිටුවා බලය විමධ්‍යගත කිරීම මගින් පෙර පාසල් අධ්‍යාපනයේ වගකීම අදාළ පළාත් සභා අතට පත් විය. මේ නිසා පළාත් පාලන ආයතන මගින් ද පෙර පාසල් පිහිටුවීමේ ක්‍රියාවලිය වේගවත් විය.
- 1997 මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතාගේ සභාපතිත්වයෙන් පැවති ජාතික අධ්‍යාපන කොමිසම මගින් පළාත් සභා හරහා පෙර පාසල් පිහිටු වීම ධෛර්යමත් කරලීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත.
- 1990 සිට ළමා ලේකම් කාර්යාලය සමග ඉතා සමීපව එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) කටයුතු කරලීම මගින් පූර්ව ළමාවිය සංවර්ධනයේ ප්‍රගමනයට වඩාත් ඵලදායී කටයුතු රාශියක් සිදුවිණි. මෙමගින් පෙර පාසල්වල ගුණාත්මකභාවය දියුණු කිරීමටත්, එම ගුරුවරුන් පුහුණු කිරීමටත් අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය සංවර්ධනයට මූල්‍ය ප්‍රතිපාදන සැපයීම මේ අතර ප්‍රධාන වේ.

එයට අමතරව ශ්‍රී ලංකාවේ පෙර පාසල් තුළ ළමයින්ගේ රැකවරණය සැපයීම පිළිබඳ ජාතික අධ්‍යයනය (2003) නම් වාර්තාව ඉදිරිපත් කිරීම මෙහි ප්‍රගමනයට වඩාත් හේතුවිය.

- 2004 වර්ෂයේ දී මුල් ළමාවිය රැකවරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට වසර 05 දක්වා වූ සේවාවන් අතර පෙර පාසල් අධ්‍යාපනය ඇතුළත් කරලීම ද මුල් ළමාවිය අධ්‍යාපනයේ නව සංවර්ධනාත්මක ප්‍රවනතා අතර වඩාත් වැදගත් එකකි.

මේ සියල්ල තුළින් ශ්‍රී ලංකාව තුළ ඉතා වේගවත්ව මුල් ළමාවිය අධ්‍යාපනයේ සංවර්ධනයේ පෙරමං සළකුණු සටහන්ව ඇත.

**කේ.එම්. මහින්ද සිල්වා**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අනුරාධපුර දිස්ත්‍රික් සම්බන්ධීකාරක**

# පාසල් නොයන දරුවන් පාසල්ගත කිරීම

පාසල් නොයන දරුවන් පාසල් ගතකිරීමට මේ සඳහා දැනටමත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අධ්‍යාපන කොට්ඨාස මට්ටමින් නොවිධිමත් අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරිවරයෙක් කොට්ඨාස කාර්යාලයේ සේවයට පත්කර ඇත. එම නිලධාරියා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් පාසල් නොයන දරුවන් පිළිබඳ තොරතුරු රැස්කරමින් ලබාගත් දත්ත අනුව පාසල් නොයන ළමුන් පාසල් ගතකිරීමට කටයුතු කරනු ලබයි. එහෙත් මෙය තවමත් සියයට සියයක් සාර්ථකව ක්‍රියාත්මක නොවේ.

දත්ත නිසිපරිදි නොලැබීම, පාසල් ගතකළ දරුවන් නැවත ඇදහැලීම, දිළිඳුබව හෝ මව දරුවා ළඟ නොමැතිවීම ආදිය ඊට හේතු වේ. බොහෝවිට එම නිලධාරින් විසින් පාසැල් ගතකරන දරුවන් පාසලේ රැඳී සිටීමේ ප්‍රවනතාව බෙහෙවින්ම අඩු මට්ටමක පැවතීම දක්නට ලැබේ. මෙයට එම ව්‍යාපෘති නිලධාරීන්ට පවත්නා වෘත්තීයමය ගැටලු හේතුකොටගෙන තමන්ගේ සේවාවන් සම්බන්ධයෙන් පවත්නා අතෘප්තිමත්භාවය ද හේතු වනවා විය හැකිය.

එබැවින් ඔවුන් බලගැන්වීම තුළින්ද මෙම ගැටලුවට යම් විසඳුමක් ලබාගත හැකි යැයි යෝජනා කරමි. පාසැල් ගතකරන දරුවන් අනුව ඔවුනට දිරිදීමනා හෝ ප්‍රසාද දීමනා ගෙවීම වැනි අභිප්‍රේරණ තුළින් ඔවුන් දිරිගැන්විය හැකි වේ.

පාසල් යන වයසේ සිටින සෑම මවක්ම දරුවා ළඟ මෙන්ම දරුවා සමග ජීවත් වේ නම් සහ දරුවන් පිළිබඳව නිරන්තර සොයා බැලීමක නිරත වේ නම් දරුවන් පාසැල් යැවීම බොහෝදුරට ඉටුවන බව අපගේ අත්දැකීම් අනුව පෙනී යයි. එවැනි මව්වරුන් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් තවදුරටත් පැවැත්වීම ගම් මට්ටමින් කළයුතු වේ. දරුවාට ආදරය, රැකවරණය, පෝෂණය ලබාදීම ආදිය පිළිබඳව දෙමව්පියන් දැනුම්වත් කිරීමට ග්‍රාමනිලධාරි සහාය ලබාගැනීම සුදුසු වේ. දරුවන් පාසල් යැවීමේදී ඔවුන් අඛණ්ඩව පාසල් යැවීම, අධ්‍යාපන කටයුතු පිළිබඳව සොයා බැලීම, සාධන මට්ටම අඩු වේ නම් සහ දරුවාට ගුරුවරුන්ගේ නිසි අවධානය යොමු නොවේ නම් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට දෙමව්පියන්ට පවත්නා වගකීම් පිළිබඳව දැනුම්වත් කළයුතු වේ. එමෙන්ම අදාළ වැඩසටහන්වල ප්‍රගතීන් සොයාබැලීම

> ක්‍රියාකාරකම් සහිත පාඩම් කොතෙක් හඳුන්වාදුන්න ද සමහර ගුරුභවතුන්ගේ සම්ප්‍රදායික බව සහ පන්තිකාමරයට ළමුන් කොටුකර දැනුම පමණක් ලබාදීම තුළින් සිසු නිර්මාණ එළිදැක්වීම සිදුකරගත නොහැකි තත්ත්වයක පවතින බව පෙනේ.

හා පසුවිපරම් අඛණ්ඩව සිදුවිය යුතුය.

දරිද්‍රතා සහිත දෙමව්පියන් හඳුනාගෙන දරුවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් "සලාකයක්" ලබාදීම මගින් දරුවන් පාසලට එවීම සහ පාසැලේ රඳවා ගැනීමට යම් විසඳුමක් ලබාගත හැකිය. රජයේ පැත්තෙන් වර්තමානයේදී නිළ ඇඳුම් ලබාදීම, පෙළපොත් ලබා දීම වැනි ප්‍රධාන කාරණා ඉටුවන අතර යම් යම් කාලවලදී පාපැදි, සපත්තු ආදිය ලබා දීමද සිදුවිය. කෙසේවුවද දරිද්‍රතා සහිත දරුවන්ට රජය පාර්ශවයෙන් යම් සලාකයන් ලබාදීම සුදුසු වන්නේ එලයට පෙර හේතුවට පිළියම් යෙදීම වඩාත් සාර්ථක වනු ඇති නිසාවෙනි. එයට රජයේ අවධානය යොමුවිය යුතුය.

එසේම ගුරුභවතුන් දරුවන් පිළිබඳ නොසළකා හැරීම, යම් යම් දඬුවම් ලබාදීම තවදුරටත් සිදුවන අවස්ථාද ඇත. සමහර දරුවන් කොටසකට සැළකීමත් තවත් කොටසකට නොසැළකීමත් වූ විට දරුවන් මානසිකව ඈද වැටීමට හේතුවන පාසැල ප්‍රියජනක ස්ථානයක් නොවීම තුළින් ද ගැටළු ඇති වේ. මා දන්නා එක් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයකුගේ දරුවා මෙම වර්ෂයේදී දහය ශ්‍රේණියට නියමිත වුවද 6 ශ්‍රේණියේ සිටම පාසල ප්‍රතික්ෂේප කරයි. දැනට ඔහු පාසල් නොයන අතර විවිධ චිකිත්සා ඔහුට ලබා දුන්නද ප්‍රතිඵල සාර්ථක නොවී ඇත. දිගින් දිගටම පාසැල ප්‍රතික්ෂේප කරයි. අනිසි හැසිරීමක්ද නොමැති නමුත් පරිගණක අනිසි ඇබ්බැහිවීමක් ඇත. පරිගණක ක්‍රීඩා සඳහා මුලදී තදබල කැමැත්තක් තිබුණි. කෙසේ වුවද මුදල් යහමින් ඇති පවුල්වල දරුවන්ද යම් ප්‍රමාණයකින් හෝ පාසල ප්‍රතික්ෂේප කරන බව පෙනේ. එසේම මෙම කරුණුවලට වඩා විෂය නිර්දේශය තුළ ශිෂ්‍ය ප්‍රජාව පාසලට ආකර්ශණය වන ආකාරයේ විෂයමාලාවක අවශ්‍යතාවය ඇතැයි සිතමි. ඉන්දියාවේ දිල්ලි නගරයේ පුද්ගලික පාසලක් නිරීක්ෂණය කිරීමේ දී එම පාසල්වල ඇති "Skill Labs" නිරීක්ෂණයට ලක් කෙරෙති. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන විශාල ධනස්කන්ධය මෙවැනි හරවත් දෙයක් සඳහා වැය කළහොත් ඉන් විශාල පිටුබලයක් ලද හැකි බව එහිදී හඳුනාගැනීමට හැකිවිය.

ක්‍රියාකාරකම් සහිත පාඩම් කොතෙක් හඳුන්වාදුන්න ද සමහර ගුරුභවතුන්ගේ සම්ප්‍රදායික බව සහ පන්තිකාමරයට ළමුන් කොටුකර දැනුම පමණක් ලබාදීම තුළින් සිසු නිර්මාණ එළිදැක්වීම සිදුකරගත නොහැකි තත්ත්වයක පවතින බව ද පෙනේ.

පාසල් මට්ටමින්, කොට්ඨාස මට්ටමින්, පළාත් මට්ටමින්ද සිසුන්ගේ දැනුම පමණක් මනින විභාගවලට දරුවන් හුරුකිරීම, ප්‍රතිඵල ඉහළ නැංවීම සඳහා කරන වැඩසටහන්, කලාප, පළාත් අතර ප්‍රතිඵල සඳහා ඇති තරගයද, සිසුන් තවදුරටත් විඩාබර කර ඇත. ආකල්ප සහ කුසලතා අධ්‍යාපනය තුළින් ප්‍රතික්ෂේප කර, දැනුමට පමණක් නැඹුරු අධ්‍යාපනයකට නැවත ගමන් කිරීම ගැටලුවකි.

තාක්ෂණය සඳහා නැඹුරුවක් ඇති කිරීමට පසුගිය කාලයේදී තාක්ෂණ පීඨ සහ මහින්දෝදය විද්‍යාගාර ඇති කළද බලාපොරොත්තු වූ මට්ටමින් මේ සඳහා සිසුන් ඇතුළත්වීමක් නැත. මුල් වර්ෂයේ තරම් ඉල්ලුමක්ද වර්තමානයේ නැත. මෙම තාක්ෂණ විෂයයන් අඩුම තරමේ 9 ශ්‍රේණියේ සිටවත් සිසුන්ගේ විෂයමාලාවට ඇතුළත් කිරීමට යෝජනා කරමි. තාක්ෂණ පීඨ සඳහා දැනට විශාල සම්පත් ප්‍රමාණයක් ලබා දී ඇතත් ඒවායින් නිසි ඵලප්‍රයෝජන නොගැනීම ද ගැටලුවක් බව කිවයුතුය.

**බී. එම් නවරත්න මැණිකේ**
**සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක (සංවර්ධන)**
**ඉබ්බාගමුව කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලය**

# ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට එක්කළ යුතු අළුත් විෂයන් පිළිබඳ අදහසක්

අධ්‍යාපන දර්ශනයේ පුරෝගාමී වූ දාර්ශනිකයන් මෙන්ම පෙරදිග බෞද්ධ, හින්දු සහ වේද ආගමික ඉගැන්වීම්වලද අධ්‍යාපනය පිළිබඳව විස්තර කෙරෙන අවස්ථාවල අධ්‍යාපන සහ සදාචාරාත්මක බව එකම කාසියේ දෙපැත්තක් ලෙස හඳුනාගෙන ඇත. උගත් පුද්ගලයෙකු වන්නේ සදාචාරාත්මක වූ විට පමණක් බව බොහෝ ආගම්වල ඉදිරිපත් කෙරෙන අදහසකි. බුද්ධිමත් බව සදාචාර වර්ධනයටත්, සදාචාර බව බුද්ධි වර්ධනයටත් එක ලෙස බැඳී පවතින බව තවත් අදහසකි. ශීලය සහ ප්‍රඥාව අත්වැල් බැඳගත් යුගල පදයක් ලෙස හඳුන්වා දිය හැකි බව කියැවේ.

"ගුණ නැණ බලෙන් යුතු පුතුමය ඉතා ගරු" යන්න අපගේ පැරැන්නන්ගේ මුවග රැඳී තිබුණ අදහසකි. ශිෂ්‍යයා යන පදය විග්‍රහ කර බැලුවහොත් එහි අර්ථ නිරූපණය වන්නේද හික්මීම ලත් තැනැත්තා යන්නයි.

ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දුන් දින සිට මේ දක්වා පාසල් විෂය තුළ සදාචාරවත් බව, සාරධර්ම, සාරධර්ම පුහුණු කිරීම, යහපත් ගුණදහම් ඉගැන්වීම වෙනුවෙන් ගෙන තිබෙන පියවර කිහිපයක් සඳහන් කළ හැකිය. ආගම ධර්මය විෂයයන් ලෙස ඉගැන්වීම ඉන් වැදගත් පියවරකි. ඊට අමතරව සමාජ අධ්‍යයනය, ඉතිහාසය, පුරවැසි පුහුණුව, සෞඛ්‍යය සහ ශාරීරික අධ්‍යනය, සාහිත්‍යය සහ විවිධ සෞන්දර්ය විෂයන් ඉගැන්වීම තුළින්ද යම් ආකාරයක සාරධර්ම අධ්‍යාපනයක් ලබාදීමට කටයුතු කිරීම දක්නට ලැබුණි. ඉහත විෂයන්ගේ විෂය නිර්දේශ එකිනෙක ගෙන සළකා බැලුවහොත් ශ්‍රී ලාංකික ළමුන්ට අවශ්‍ය සදාචාරය හෝ සාරධර්ම එම විෂයන් තුළින් ඕනෑවට වඩා ලබා දෙන්නේ යැයි කෙනෙකුට තර්ක කළ හැකිය.

එසේ වුවද ඉහත සඳහන් සදාචාරාත්මක සිදුවීම් ඇතුළත් විෂය කොටස් පාසල තුළ ඉගැන්වෙන ස්වරූපය මදක් විමසා බලමු.

බෞද්ධ හා අනෙකුත් ආගම්වලද ආගම් ඉගැන්වීම පූර්ව පාසල් අවධියේ සිට ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. ආගම උගන්වන විට එහි වඩා වැදගත් වන්නේ න්‍යායාත්මක පදනමට වඩා ප්‍රායෝගිකව ළමයා සාරධර්ම ගතිගුණ කෙරෙහි හුරුකිරීමයි. කුඩා කල සිටම ආකල්පමය වෙනසක් කළ හැකි වන්නේ එසේ වුවහොත් පමණක් බව පැවසිය යුතුය. බොහෝවිට පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල සහ පාසලේ පහළ ප්‍රාථමික අවධියේ දී යම් යම් ආගමික සහ සදාචාරාත්මක ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාත්මක වනු දක්නට ලැබීම ප්‍රසංශා කළ යුතුය.

බෞද්ධ හා අනෙකුත් ආගම්වලද ආගම් ඉගැන්වීම පූර්ව පාසල් අවධියේ සිට ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. ආගම උගන්වන විට එහි වඩා වැදගත් වන්නේ න්‍යායාත්මක පදනමට වඩා ප්‍රායෝගිකව ළමයා සාරධර්ම ගතිගුණ කෙරෙහි හුරුකිරීමයි.

එසේ වුවද පූර්ව පාසල් අවධියේ සහ ප්‍රාථමික අවධිවල සිසුන්ට සදාචාර වර්ධනය ඇතිකිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය ලෙස දක්වන්නේ ස්වභාවධර්මය සහ සතුන්ට ආදරය කිරීමට ඉගැන්වීමයි. බොහෝ රටවල මේ අවධියේ දරුවන් වෙනුවෙන් පාසල තුළ ස්වභාවධර්ම අංගනයක් සහ සුරතල් සතුන් ඇතිකරන ස්ථානයක් සූදානම් කර ඇත. ඒ මගින් සතුන්ට කෑම දීම, සාත්තු සප්පායම් කිරීම තුළින් සතුන්ට ආදරය කිරීමට හුරුව ලබන අතර පසුව එම ආදරය තම සහෝදර සිසුන්ට සහ සමාජයටද සිදුකරන්නට පෙළඹවීමත් ඇති වේ. මෙම තත්ත්වය අපේ අධ්‍යාපන ආයතනවල තිබේද යන්න ගැටලුවකි.

දැනට පවතින 5 වසර ශිෂ්‍යත්ව විභාගය හේතුකරගෙන 4 - 5 වසරවල බුද්ධාගම ඇතුළු අනෙක් ආගම් ඉගැන්වීම, අතපසුවීම මෙන්ම මගහැරීම් ද සිදුවන බව පාසල් බලධාරීන් පවා පිළිගන්නා කරුණකි. 6 වසර සිට 11 වසර දක්වා බුද්ධාගම විෂය ඉගැන්වීම විධිමත් ක්‍රියාවලියක් වන නමුත් පාසල් තුළ එය හරියාකාරව සිදුනොවන්නේ එම විෂය පාසල් ළමුන්ගේ විභාගය සඳහා එතරම් බරසාර විෂයක් නොවීමත් එය පහසුවෙන් ඉගෙනගත හැකි යැයි සිතා සිටීමත් හේතුවෙනි. ඉහත කී කරුණු සැළකිල්ලට ගත් විට පැහැදිලි වන්නේ පාසල් විෂයන් තුළ ආගම ධර්මය ඉගැන්වීම තුළින් වඩා සාර්ථක සාරධර්ම ගොඩනැගීමක් සිදු නොවන බව නොවේද?

ආගම ධර්මයට අමතරව මෙහි සඳහන් කළ විෂයන් මගින් ළමුන්ගේ සදාචාරය ගොඩනැගිය හැකිද? සාහිත්‍යය සහ ඉතිහාසය යන විෂයන් කලක් පාසල් විෂය මාලාවෙන් ඉවත්කර තිබූ බව මතකයට නගා ගත හැකිය. මෙහි සඳහන් අනෙකුත් විෂයන්ද පාසල් පන්තිකාමරයේ සියලුම සිසුන්ට එක සේ ගලා නොයනවා පමණක් නොව ඒවාද එතරම් විධිමත් සහ කැපී පෙනෙන ස්වරූපයකින් පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මකවනවා දැයි යන්න ප්‍රශ්නයකි. උදාහරණයක් ගතහොත් ශාරීරික අධ්‍යයනය සහ ක්‍රීඩා විෂයභාර ගුරුවරයා විසිනි. එම විෂය ඉගැන්වීම බොහෝවිට පාසලේ ක්‍රීඩා උත්සවය පවත්වන අවධියේ ඉතා ඕනෑකමින් සිදුවන නමුත් අනෙක් කාල තුළ එය මන්දගාමී ලෙස ඉගැන්වෙන අවස්ථා අප දැක ඇත.

ළමයෙකු තුළ සදාචාරය ගොඩනැගීම යනු බොහෝ සෙයින් ආකල්පමය වෙනසක් සිදුකිරීමෙන් පමණක් සිදුකළ යුත්තකි. සදාචාර අධ්‍යාපනය සඳහා අවශ්‍ය මෙම ආකල්ප වෙනස සිදුකිරීම විෂයක් ඉගැන්වීමට වඩා අසීරු කරුණක් බව පිළිගත යුතුය. මෙවැනි ආකල්ප වෙනසකට අනුගමනය කළයුතු විශේෂ ක්‍රමවේද ඇතිබව සාරධර්ම අධ්‍යාපනය පිළිබඳ න්‍යායක් ඉදිරිපත් කළ නෝමන් ජේ. බුල්, ජීන් පියාජේ, කෝල්බර්ක්, එමිල් ඩර්කයිම් වැනි දාර්ශනිකයන්ගේ න්‍යායන්වල පැහැදිලිව දක්වා තිබේ. ඉහත කරුණු සැළකිල්ලට ගත්විට පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය තුළ සාරධර්ම අධ්‍යාපනය ඉගැන්වීමේ අවස්ථා හා ක්‍රමවේද බෙහෙවින් දුර්වල මට්ටමක පවතින බවයි.

ලෝකයේ බොහෝ රටවල් සාරධර්ම අධ්‍යාපනය වෙනම විෂයක් ලෙස උගන්වන අවස්ථා දක්නට ලැබේ. ජපානයේ පාසල්වල එය Life Guidance හා Ethic Civics යනුවෙන් හඳුන්වා ඇත. සෝවියට් රුසියාවේදී එම විෂය හඳුන්වා ඇත්තේ Communist Morality and Cultural Conduct යනුවෙනි. ඉන්දියාවේ එය නම් කර ඇත්තේ Human Values යනුවෙනි.

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනයේ අවසන් ප්‍රතිඵල දෙස විමසිල්ලෙන් බැලීමෙන් පසු පමණක් යම් තීරණයකට එළඹීමට පාඨක අපට සිදු වේ.

1. පාසල් වයසේ අවසන් අදියරේ පසුවන සහ පාසල් වයස අවසන් කළ තරුන පිරිස් අතුරින් විශාල පිරිසක් අද මත්

12 වන පිටුවට

# උගතමනා ශිල්පයමද මතු රැකෙනා
# මතු රැකෙනා ශිල්පයමද උගතමනා

වෛද්‍ය අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම පිළිබඳව මෑතකදී ප්‍රශ්නයක් මතු විණි. ඒ අනුව සයිටම් (South Asian Institute for Technology and Medicine) යන්න පුළුල් ලෙස සමාජගත විය. එහෙත් අප විමතියට පත් වන්නේ අපේ නිදහස් අධ්‍යාපනය පිළිබඳ දුන් දුන් කාට කාටත් සිහිපත් වීම පිළිබඳවය. අපේ අධ්‍යාපනය ඇත්තටම නිදහස් ද, කන්නන්ගර දැක්ම ක්‍රියාත්මක වන්නේ ද වැනි කරුණු පිළිබඳව සයිටම් ප්‍රශ්නය මතු වූ පසුවවත් සිතා බැලුවහොත් නරක ද ? සිතා බැලීම කෙසේ වුව ද සයිටම් ගැන කතා කරන්නේ නිදහස් අධ්‍යාපනය හුවා දක්වමිනි.

එහෙත් මේ කුමන කෝණයකින් බැලුව ද මේ වන විට මෙරට අධ්‍යාපනය බරපතළ ගැටලු රාශියකට මුහුණදී ඇත. ඒ ගැන කිසිවකු සිතන්නේ නැත. ඒ ඒ අවස්ථාවේ පැන නැගෙන ගැටලුව දෙස පමණක් බලන අපේ සමාජය පාට උපැස් යුවල ගලවා දැස් විවර කර බලා යථාර්ථය අවබෝධ කර ගැනීමට දැන්වත් සිතිය යුතුය. එසේ වුවහොත් පඹගාලක පැටලී ඇති අධ්‍යාපනය ඉන් ගලවා ගැනීමට පිටුවහලක් වනු ඇතැයි සිතේ. කන්නන්ගර යුගයේ ඇරඹි නිදහස් අධ්‍යාපනය ආඩම්බරව ඉහළින් අගය කරන අපගේ වර්තමාන තර්කය වී ඇත්තේ එවන් තත්ත්වයක් තිබිය දී අධ්‍යාපනය පෞද්ගලීකරණය වන්නට ඉඩ දිය හැකි ද යන්නයි. එහෙත් ප්‍රශ්නය නම් ඇත්තටම අද අප නිදහස් අධ්‍යාපනයක් භුක්ති විඳිනවා ද? මේ පිළිබඳව විමසිලිමත් නොවන්නේ ඇයි? සයිටම් උණුසුම පවතින මේ මොහොතේවත් ඒ ගැන සිතිය යුතුය.

පාසලකට ළමයෙක් ඇතුළු කිරීමේ දී එදා පැවති නිදහස් අධ්‍යාපන සංකල්පය අද තිබේ ද? අධ්‍යාපනය පෞද්ගලික කිරීමට අත්පොත් තැබෙනුයේ එතනින් නොවේ ද? ඒ ඒ පාසල්වල තරාතිරම අනුව මූල්‍යමය දීමනාව ගෙවීම අද අනිවාර්ය්‍යය. ධවල පත්‍රිකා මගින්ම (ක්‍රීඩාගාර, ගොඩනැගිලි) විවිධ අරමුණු සඳහා යැයි මූල්‍යමය ගෙවීම් සිදු කළ යුතුමය. කෙතරම් දුෂ්කර ප්‍රදේශවල වුව ද මෙය බලපායි. එදා නිදහස් අධ්‍යාපනයෙන් මෙවැන්නක් බලාපොරොත්තු විණි ද? නැත. මේ වන විට මේ තත්ත්වය සමාජගත වී හමාරය. අඩු ආදායම්ලාභී දෙමව්පියන්ගේ දරුවන්ට කෙතරම් සහජ දක්ෂතා තිබුණ ද ඉහළ මට්ටමේ හෙවත් පහසුකම් සහිත පාසලකට ඇතුලු කළ නොහැකිය. එය ද නිදහස් අධ්‍යාපනය ?

පාසල්වලට දරුවන් ඇතුළු කිරීමේ දී පවතින මේ අවිධිමත් ක්‍රමවේදයට පිළියම් යෙදීම දැන්වත් ජනතාව කල්පනා කළ යුතුව ඇත. බලධාරීන්ගේ දෑස් විවර කළ යුතුය. පහත ශිෂ්‍යත්වය පිළිබඳ විමසා බලමු. එය ද සම්පූර්ණයෙන්ම මුදලට විකිණෙන්නකි. පස්වන පන්තියේ සෑම ළමයෙකුම මුදල් වැයකර පෞද්ගලික පන්තියකට යෑම අනිවාර්ය වී ඇත. පවතින තත්ත්වය අනුව ඒ ඒ පාසල්වලින් මෙපමණ සංඛ්‍යාවක් ශිෂ්‍යත්වය සමත් ව ඇතැයි ප්‍රකාශ කළද ඇත්ත වශයෙන්ම එහි සාර්ථකත්වය පෞද්ගලික පන්තිවලින් සිදුවන්නකි. වයඹ පළාතේ මීගමුව දිස්ත්‍රික්කය වැනි ප්‍රදේශවල ශිෂ්‍යත්වය සමත්වීමේ අඩු ප්‍රතිශතයන් තුළින් පැහැදිලි වන්නේ එම ප්‍රදේශයන්හි පෞද්ගලික පන්ති සංඛ්‍යාව අඩු වීමත් අධ්‍යාපනයෙහි පරමාර්ථය හෙවත් අරමුණ උගත් බුද්ධිමතුන් බිහි කිරීමට වඩා ඉතාලිය වැනි රටක ජීවන මාර්ගයක් සොයා යාමක් බවයි.

2015 වසර 5 ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ළකුණු ලබා ගැනීමේ මෙම සටහන දෙස බලමු.

| පාසල | පෙනී සිටි සිසුන් සංඛ්‍යාව | සමත් සිසුන් |
|---|---|---|
| මීගමුව ශාන්ත මරියා විදුහල | 71 | 1 |
| මීගමුව ශාන්ත ජෝශප් විදුහල | 70 | 1 |
| මීගමුව දළුපොත විදුහල | 57 | 1 |
| කටාන කඳවල ජෝශප් කණිෂ්ටය | 39 | 1 |
| ජාඇල තිඹොඩ විදුහල | 88 | 1 |

පෙර කී පරිදි මෙම ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපනය විදේශගත විය හැකි වෘත්තිකයන් බිහි කිරීම වැනි පටු ක්ෂේත්‍රයන්ට සීමා වී ඇත. අනාගතයේ දී සමස්තයක් ලෙස එය සිදුවනු නියතය. ඉන්පසු සාහිත්‍යධරයන්, විචාරකයන්, චින්තකයන්, දාර්ශනිකයන් හෝ බුද්ධිමතුන් නැත්තටම නැතිව යනු නියතය. එය ද මනුෂ්‍යත්වයේ සංවර්ධනය? පහත ශිෂ්‍යත්වය මෙන්ම සාමාන්‍යපෙළ සහ උසස්පෙළ සමත්වීම ද අද පෞද්ගලික පන්ති මතම රඳා පවතියි. එසේ නම් ඉන්පසුව අධ්‍යාපන ක්ෂේත්‍රයන් පෞද්ගලීකරණය ප්‍රශ්නයක් වන්නේ කෙසේ ද? මින් අප අදහස් කරනුයේ "සයිටම්" අගය කිරීමක් නොව එය ප්‍රශ්නයක් කර ගැනීමට පළමුව ඊට පෙර තත්ත්වය දෙස මෙතෙක් නොබැලුවේ ඇයි ද යන ප්‍රශ්නය මතු කිරීමයි. ඒ තත්ත්වය ආරම්භයේ සිටම මෙසේ ඔඩුදුවන තෙක් අප සෑම සිටියේ දෑස් වසාගෙන නොවේ ද? දැන්වත් අප

අධ්‍යාපනයේ අරමුණ වන්නේ මිනිස් වර්ගයාගේ යහපත (සංවර්ධනය) සඳහා ක්‍රියාත්මක වන යහපත් පුරවැසියෙකු බිහි කිරීම බව එක්සත් ජාතීන් පවා පිළිගෙන ඇත.

නිදහස් අධ්‍යාපනයේ සුලමුල හඳුනාගත යුතුව ඇත. ඒ සමගම එම සංකල්පය කාලීන වශයෙන් අවශ්‍ය හිතකර වෙනස්වීම්වලට ද භාජනය විය යුතු නම් එය ද අවශ්‍යය. එහෙත් ඒ සඳහා බුද්ධිමත්ව සිතා බැලීමට හැකි උසස් මනසක් ද අවශ්‍යය. මේ වන විට පවතින අධ්‍යාපන ක්‍රමය තුළින් එවන් පුද්ගලයන් බිහි වීම අවදානමකට පත්ව ඇත. එම තත්ත්වය තවදුරටත් පැවතුනහොත් සිදුවිය හැක්කේ රොබෝ මිනිස් සමාජයක් පමණක් අපට දක්නට ලැබීමයි. ශික්ෂණයකින් තොර එවන් සමාජයකින් සිදුවිය හැකි යහපත කුමක් ද? දේශයක සංවර්ධනය මානුෂිකත්වය වැනි වදන්හි ඇති විග්‍රහයක් එවන් සමාජයකට අවශ්‍ය නැත. මේ පවතිමින් ඇත්තේ එවන් සමාජයකට මුල පිරීමකි.

අධ්‍යාපනයේ අරමුණ වන්නේ මිනිස් වර්ගයාගේ යහපත (සංවර්ධනය) සඳහා ක්‍රියාත්මක වන යහපත් පුරවැසියෙකු බිහි කිරීම බව එක්සත් ජාතීන් පවා පිළිගෙන ඇත. විශේෂයෙන්ම මිනිස් වර්ගයාගේ දියුණුවත් සමග එම අරමුණ තවත් පුළුල් වනු මිස කුමන හෝ ජීවන වෘත්තියක් සඳහා සැපයෙන මිනිස් ශරීරයක් පමණක් ප්‍රවර්ධනය කිරීම අධ්‍යාපනයේ කාර්යභාරය නොවේ. මේ බැව් පාලකයන් වටහා ගත යුතුය. එසේ නොවුනහොත් අනාගතයෙහි දැකිය හැකි වන්නේ හිස් වූ මොළ පමණක් ඇති රූකඩ මිනිස් සමාජයකි. පෝෂණයක් නැති මනස තුළින් මානුෂීය පැවතුම් බලාපොරොත්තු විය නොහැක. මේ වන විටත් ඉහළ මට්ටමේ සිටම දූෂණය, භීෂණය වැනි වදන් සමාජ රෝග බවට පත් වෙමින් පවතිනුයේ මෙම නිසාය. එබැවින් මිනිස්කම රැකගැනීමට නම් මිනිසා කුඩා අවධියේ සිටම යහපත් මනසක් ඇති පුද්ගලයෙකු කිරීමට අධ්‍යාපනය ලබා දිය යුතුමය. ඒ මුදලට නොව මිනිස් අයිතිවාසිකමක් වශයෙනි.

**ජේ.ශීලා වික්‍රමරත්න**

# 2017 අයවැය යෝජනා මගින් වතුපාසල් සංවර්ධනය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු වී තිබේද ?

2017 අයවැය යෝජනා මගින් ද වතු පාසල් ක්ෂේත්‍රයේ අධ්‍යාපන සංවර්ධනයට අදාළ ගැටලු රාශියක් හඳුනා ගත හැකිව තිබේ. එය වඩාත් හොඳින් සැසඳිය යුතු වේ.

ඒ අනුව 2016 අයවැය යෝජනා මෙලෙස දැක්වේ .

313 - එසේම වැවිලි ක්ෂේත්‍රයේ පාසල් 25 ක් ද්විතීක මට්ටමට උසස් කිරීම සඳහා සම්පත් ලබාදෙනු ලබන අතර ඒ සඳහා රුපියල් මිලියන 250 ක් ලබා දීමට මා යෝජනා කරනවා (313 යෝජනාව, පිටු අංක 54)

එහි දිගුවක් ලෙස දැකිය හැකි මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2017 අයවැය යෝජනාවේ මෙලෙස සඳහන් වේ.

96 - අපගේ රජයේ සියලු අංශ ඇතුළත් සංවර්ධන ක්‍රමෝපායන්ට අනුව දැනටමත් උසස් තත්ත්වයට පත්කර ඇති විශේෂයෙන්ම කෑගල්ල සහ බදුල්ල දිස්ත්‍රික්කවල වතු පාසල් 25 ට අමතරව තවත් වතු පාසල් 25 ක තත්ත්වය උසස් කිරීම සඳහා රුපියල් මිලියන 250 ක් වෙන් කිරීමට මා යෝජනා කරනවා (96 යෝජනාව, පිටු අංක 19)

මුලින්ම 2016 අයවැය යෝජනාව පරිදි එම වර්ෂයේ දී වතු පාසල් කොපමණ ප්‍රමාණයක් සංවර්ධනය කළාදැයි හඳුනා ගත යුතුය. අප එම වර්ෂයේ (2016) අයවැය යෝජනාවේ පරිදි වතු පාසල් 25 ම ද්විතියක මට්ටමට උසස් කිරීම සිදු වී ඇතැයි විශ්වාස කරමි.

අධ්‍යාපන අමාත්‍යංශය 2015 වසරේ දී නිකුත්කොට ඇති සංඛ්‍යා ලේඛන තොරතුරුවලට අනුව ශ්‍රී ලංකාවේ මුළු පාසල් සංඛ්‍යාව 10144 කි. එයින් 843 ක් වතු පාසල් වේ. ඒ අනුව වතු පාසල් 25ක් යනු මුළු වතු පාසල් සංඛ්‍යාවෙන් 2.9% ක ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට දරණ උත්සාහයක් වේ. මෙම තත්ත්වය තුළ දැනට පවතින වතු පාසල් 843 ක ප්‍රමාණය සංවර්ධනය කිරීම සඳහා අවම වශයෙන් වසර 33 කට වැඩි කාලයක් ගතවනු ඇත. එසේම වතු පාසල් 307 ක් වන වැඩිම ප්‍රමාණයක් සහිත නුවරඑළිය දිස්ත්‍රික්කය පිළිබඳව ද මෙවර 2017 අයවැය යෝජනා මගින් හෝ අවධානයක් යොමුකර ඇති බවක් දක්නට නොමැත. එම නිසා මේ පිළිබඳව වගකිව යුත්තන්ගේ අවධානය වහාම හෝ 2018 අයවැය යෝජනා තුළ දී හෝ යොමුවනු ඇතැයි විශ්වාස කරමි.

කලාභූෂණ රාජ්‍ය සම්මානලාභී
කේ.ඩී. පීරිස්
සභාපති
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

# අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ වාර්ෂික සභා රැස්වීම 14 වන වරටත් සාර්ථකව පවත්වයි.





අධ්‍යාපන සංවර්ධන සන්ධානය සියලුදෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් ලබා දීම සහතික කිරීම සඳහා කැපවී ක්‍රියාකරන සිවිල් සමාජ සංවිධාන එකතුවකි. 2004 වසරේ ආරම්භ කරන ලද මෙම සංවිධානය වසර 13 ක කාල සීමාවක් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය නගා සිටුවීමට විවිධ පැතිකඩ ඔස්සේ දායකත්වය ලබා දී ඇති අතර එහි 14 වන වාර්ෂික සභා රැස්වීම අප්‍රේල් මස පළමුවන දින මාලඹේ තලාහේන ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ දී සාමාජික සංවිධාන 54 ක සහභාගිත්වයෙන් පැවැත් විණි.

රැස්වීමේ වැඩකටයුතු ආරම්භ කරමින් සභාපති කේ. ඩී. පීරිස් මහතා සාමාජිකයන් පිළිගැනීමේ කතාව සිදුකළ අතර ලේකම් W W වෙල්ලාල මහතා විසින් වාර්ෂික සභා රැස්වීම් වාර්තාවත්, භාණ්ඩාගාරික චමින්ද පියසේකර මහතා විසින් අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ වාර්ෂික අයවැය වාර්තාවත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒවා සභා සම්මත විය.

මේ අවස්ථාවේදී සාමාජික සංවිධාන විසින් අධ්‍යාපන සංවර්ධන සන්ධානය පසුගිය වසර තුළ ලබා ඇති ප්‍රගතිය පැසසුමට ලක්කරමින් අදහස් දක්වන ලදී.

2030 වසරේදී සැමට යාවජීව අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කරමින් අන්තර්කරණය සහ සම අවස්ථා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීම නම් වූ තිරසාර සංවර්ධන ඉලක්කයන්හි 4 වන අරමුණ සාක්ෂාත් කර ගැනීමට සිවිල් සමාජීය දායකත්වය සක්‍රියව ලබා දීමට පොරොන්දු වෙමින් 14 වන වාර්ෂික මහසභා රැස්වීම සාර්ථකව නිමා විය.

---

10 වන පිටුවෙන්

උවදුරට ගොදුරු වී සිටින බව පළ වේ.

2. එම පිරිස් අතුරින් මානසික රෝගී වූ සහ විවිධ ආතති තත්ත්වයන්ට ගොදුරු වූ විශාල පිරිසක් ගැන අසන්නට ලැබේ.
3. ශ්‍රී ලාංකික බොහෝ තරුණ පිරිස ජාති සහ ආගමික භේද කරපින්නා ගැනීම මිත්‍යා සහ අන්ධ විශ්වාස පිළිපැදීම වැනි සමාජ විරෝධී ආකල්ප දරන්නන් වී සිටීමද ගැටළු සහගත කරුණකි.
4. තවද එවැනි තරුණ කණ්ඩායම් තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් සෑදී සමාජයේ විවිධ අපරාධ හා සාහසික ක්‍රියාවල යෙදෙනු අසන්නට ලැබේ.
5. පාසල් වයසේ පසුවන ඇතැම් පිරිස් අතර සිදුවන අමනාපකම් දුරදිග ගොස් ජීවිත හානි පවා සිදුවන අවස්ථා අසන්නට ලැබේ.
6. එකී වයස්වල සිදුවන සියදිවි නසා ගැනීම් ද ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී.

මෙම තත්වය මගහැරීම සඳහා සාරධර්ම අධ්‍යාපනය විෂයක් වශයෙන් ශ්‍රී ලංකාවේ පාසල් විෂය මාලාවට එක්කිරීම පිළිබඳව බලධාරීන් විමසිලිමත් විය යුතුව තිබේ.

ඩබ්. ඩබ්. විජේවන්ත වෙල්ලාල

# කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලද කේ. ඩී. පීරිස් මහතා



අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව නෙලුම්පොකුණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී අමාත්‍ය එස්. බී නාවින්න මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ 2016 කලාභූෂණ රාජ්‍ය සම්මාන උළෙලේ දී අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සභාපති කේ. ඩී පීරිස් මහතා ශ්‍රී ලංකාවේ කලා ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ඉටුකරන ලද විශිෂ්ට සේවාවට උපහාර වශයෙන් කලාභූෂණ රාජ්‍ය සම්මානයෙන් පිදුම් ලැබීය.

පුත්තලම දිස්ත්‍රික් සංස්කෘතික බලමණ්ඩලයේ ප්‍රධාන ලේකම් වශයෙන් කටයුතු කරන, ජාතික පුවත්පත් කිහිපයකම ප්‍රාදේශීය වාර්තාකරුවෙකු ලෙස කටයුතු කොට ඇති කලාභූෂණ රාජ්‍ය සම්මානලාභී ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වන පීරිස් මහතා මේ වන විට "හඬ", "ආසිරි" හා "පුත්තලම දිසා පුවත්" යන ප්‍රකාශනවල සංස්කාරක මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික නොවන හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට අමුද්‍රව්‍යයක් ලෙස පොල් මටුල්ල හඳුන්වාදීමට දායකවී ඇති කේ. ඩී. පීරිස් මහතා කොළඹ මාර්ග පර්යේෂණ ආයතනයේ පර්යේෂකයෙකු ලෙස ද, ඉරෙඩ් හා අයි.ටී.ඩී.ජී ආයතනවල උපදේශකවරයෙකු ලෙස ද කටයුතු කොට ඇත. එම අත්දැකීම් සහ අභාෂය තුළින් ග්‍රන්ථකරණයට පිළිපන් ඔහු රචනා කිරීමට දායක වූ ග්‍රන්ථ සංඛ්‍යාව 20 කට අධිකය. "නවගම්පුර සහ ආරාම පෙදෙස", "කෙසෙල් කෙන්දෙන් මැවෙන අත්කම්", (සිංහල හා දෙමළ) "පොල්මටුල්ලෙන් අත්කම්" (සිංහල සහ ඉංග්‍රීසි), "පමා නොවී එම් අකුරට මෙයින් මතු", "විශ්වයෙන් අතැඹුලක්", "ලෝකය මම සහ හෙට", "රස මිහිරයි මවගේ නම පුතුට නැතී", "නිවැරදිව ලියමු" ආදිය ඉන් සමහරකි.

සාහිත්‍යය, කලාව හා ප්‍රජා සංවර්ධන ක්ෂේත්‍රයට ලබා දුන් සේවය අගය කරමින් "ප්‍රජාසේවා", "ප්‍රජාසේවා කීර්ති", "දේශ කීර්ති", "මාධ්‍ය සේවා", "දේශ බන්දු" "ජාතික ගෞරව සම්මාන උපාධිය", "දේශමාන - මානව හිතවාදී", "කලාදිනේ", "මුළු දිවයිනටම සාම විනිසුරු" යන සම්මාන සහ නම්බුනාම ද මොහු වෙත පිරිනමා ඇත.

එසේම පීරිස් මහතා කාබනික ගොවිතැන, ඉඩම් ප්‍රතිසංස්කරණය හා ග්‍රාම සංවර්ධනය, ප්‍රජා සංවර්ධනය, විකල්ප සෞඛ්‍ය සැලසුම් සකස් කිරීම, ජෛව ස්කන්ධ බලශක්ති කළමනාකරණය, අධ්‍යාපන සැලසුම්කරණය ඇතුලු විෂයන් පිළිබඳව තායිලන්තය, ඉන්දියාව, ස්විට්සර්ලන්තය, පිලිපීනය, චීනය, බංගලාදේශය, නේපාලය, කාම්බෝජය ඇතුළු රටවල් ගණනාවක පුහුණුව ද ලබා ඇත්තෙකි.

පුත්තලම, මාදම්පේ
පබසර සුපුන්

# අධ්‍යාපන සංවර්ධන සන්ධානය 2017 වසරේ පළමු දිස්ත්‍රික් සම්බන්ධිකරණ රැස්වීම පවත්වනු ලබයි



අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ දිස්ත්‍රික් සම්බන්ධකාරකවරුන්ගේ රැස්වීමක් 2017 මැයි මස 15 වැනි දින කොළඹ 06 හැව්ලොක් ටවුමේ පිහිටි සාමයික මධ්‍යස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී. දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරීන් 17 දෙනෙක් මෙයට සහභාගී වූ අතර 2017 වසරේ මෙතෙක් පැවැති වැඩසටහන් පිළිබඳව සමාලෝචනය කිරීමත් ඒ සම්බන්ධයෙන් සාමාජික සංවිධාන දැක්වූ ප්‍රතිචාර පිළිබඳ සාකච්ඡා කිරීමටත් මෙහිදී අවස්ථාව උදාවිණි. අධ්‍යාපනය සංවර්ධන සන්ධානය විසින් මෙම වසරේ දෙවන භාගයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන වැඩසටහන් පිළිබඳව දිස්ත්‍රික් සම්බන්ධිකාරකවරුන් දැනුම්වත් කිරීම මෙහිදී සිදුවිණි. මෙයට අමතරව එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තුමේන්තු වේ මූල්‍ය අනුග්‍රහය මත සිදුකිරීමට අපේක්ෂා කරනු ලබන අධ්‍යාපන ක්ෂේත්‍රයේ දූෂණ අවම කිරීම සඳහා වූ නව ව්‍යාපෘතිය පිළිබඳ මූලික හැඳින්වීමක්ද මෙහිදී සිදුකරන ලදී.

# තිරසාර සංවර්ධන අරමුණු ජයගැනීම සදහා සිවිල් සමාජයට උපරිම දායකත්වයක් ලබාදිය හැකියි !



"2030 තිරසාර සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයේ, තිරසාර සංවර්ධන අරමුණු 17 ක් විස්තර කෙරෙනවා. එහි 04 වන අරමුණ අධ්‍යාපනයයි. සියලුදෙනාම අන්තර්කරණය වූ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාගැනීමට සමාන අවස්ථා සැලසීම සහ අඛණ්ඩ ඉගෙනීම් අවස්ථා තහවුරු කිරීම යන්නට ඒ යටතේ ප්‍රමුඛ අවධානයක් යොමුව තිබෙනවා. එම තිරසාර සංවර්ධන අරමුණු 17 ජයගැනීම සඳහා ඉලක්ක 169 ක් හඳුනාගෙන තිබෙනවා. ශ්‍රී ලංකාවේ රේඛීය අමාත්‍යාංශ 51 ක් හා ආයතන 425 ක් මෙම තිරසාර සංවර්ධන ඉලක්ක ජයගැනීම වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. මෙහිදී රජයට කළහැකි දේවල්වල යම් යම් සීමාවල් තිබුණත් සිවිල් සමාජයට කළහැකි දේවලට කිසිදු සීමාවක් නෑ. ඔවුන්ට උපරිම වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු ජයගැනීම සඳහා දායක විය හැකියි."

තිරසාර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ උපදේශක උචිත ද සොයිසා මහතා මෙම අදහස් පළකළේ පසුගියදා (2017 පෙබ 03) කොළඹ, දකුණු ආසියා සහයෝගීතා ආයතන (SAPSRI) ශ්‍රවණාගාරයේදී පැවැති තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීමේ මගසැලැස්ම සංවර්ධන කිරීම සඳහා සිවිල් සමාජ සංවිධානවල අදහස්-යෝජනා ලබාගැනීමේ උපදේශනාත්මක සාකච්ඡාවට සහභාගී වෙමිනි.

තිරසාර සංවර්ධන අරමුණු හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉලක්කයන් ජයගැනීම සඳහා වූ ජාතික වැඩසැලැස්ම සැකසීමට සාමාජිකත්ව සංවිධානවල දායකත්වය ලබාගැනීමේ අරමුණින් අධ්‍යාපන සංවර්ධන සන්ධානය සංවිධානය කළ මෙම උපදේශනාත්මක සාකච්ඡාවට (CED) සාමාජිකත්ව සංවිධාන 35 ක ක්‍රියාකාරී නියෝජිතයෝ 40 ක් සහභාගී වූහ.

ආසියා පැසිපික් කලාපය තුළ තිරසාර සංවර්ධනය පිළිබඳ කැබිනට් අමාත්‍යාංශයක් පවත්නා එකම රට ශ්‍රී ලංකාව බවද, දරිද්‍රතාවය තුරන් කිරීමේ වර්ෂය ලෙස නම්කර ඇති 2017 වර්ෂය තුළ තිරසාර සංවර්ධනය වෙනුවෙන් විශාල කාර්යභාරයක් ඉටුකිරීමේ වගකීමක් ශ්‍රී ලංකාවට පැවැරී ඇති බවද උචිත ද සොයිසා මහතා මෙහිදී වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

"ලංකාවේ නව රජය බිහිවීමත් සමග තිරසර සංවර්ධනය පිළිබඳ පනතක් සම්පාදනය කෙරුණා. පසුගිය ජනවාරි 9 වැනිදා අගමැතිතුමන් එය සභාගත කළා.එය පළාත් සභා හතරක් අනුමත කරලා එකක් ප්‍රතික්ෂේප කරලා තියෙනවා. ලංකාවේ මින්පසු මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභා ආදී සියලුම සංවර්ධන සැළසුම් තිරසර සංවර්ධනයට අනුගත විය යුතුයි. එසේම පසුගිය වසර අවසානයේදී මෙම විෂය සම්බන්ධයෙන් කටයුතු කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 15 දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත්කරනු ලැබුවා. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක වන ආකාරය නිරීක්ෂණය කිරීම ඔවුන්ට පැවැරී ඇති ප්‍රධාන වගකීමක්. ඊටත් අතිරේකව, පසුගිය ජනවාරි 02 වැනිදා සිට තිරසර සංවර්ධන කටයුතු පිළිබද සොයාබැලීම සදහා ජනාධිපති තුමා විසින් කැබිනට් අනුකමිටුවක් පත්කර තිබෙනවා. මේ සියලු අංශ එක්ව කටයුතු කළහොත් ඉදිරි කාලය තුළ තිරසර සංවර්ධනය පිළිබඳ බලාපොරොත්තු රැසක් ඇතිකරගත හැකියි."

"තිරසර සංවර්ධනය පිළිබඳ ලොව පුරා විවිධ නිර්වචන රැසක් තිබෙනවා. සමහර නිර්වචනවල තිරසර සංවර්ධනය පිළිබදව කතාකරන්නේ තනි මානයකින්. ආර්ථික සංවර්ධනය කියන මානයෙන්. ඒත් මහාචාර්ය කොටගම වගේ අය පරිසරය අනුව සමාජයේ ජීවන චර්යාව තීරණය වන බවත්, ඒ මත ආර්ථිකය හැසිරෙන බවටත් අදහස් පළකරනවා. අපි තිරසර සංවර්ධනය පිළිබඳව සාකච්ඡා කරන විට ප්‍රධාන මාන තුනක් පිළිබදව අවධානය යොමු කරනවා.ඒ පරිසරය, සමාජය හා ආර්ථිකයයි. මේ අංශ තුනෙහිම සමානාත්මතාවයක් පවත්වාගෙන යාමත් ඉතාම වැදගත්. අපි පරිසරය ආරක්ෂා කරන්නේ කෙසේද?, දේශගුණික විපර්යාසවලට මුහුණ




දෙන්නේ කෙසේද?, දරිද්‍රතාවය තුරන් කරන්නේ කෙසේද? යනාදී කාරණා මුළු ලෝකයටම බලපාන ප්‍රශ්න. මේවා එකකට එකක් සම්බන්ධයි. එසේම මේවා වෙන් වෙන්ව ගෙන විසඳුම් සෙවීමට යාමත් අසාර්ථකයි."

සංවර්ධනය පිළිබඳ සැළකුවාම පසුගිය සියවස් ගණන තුළ අප සංවර්ධනය වෙන්න උත්සාහ කරල තියෙන්නේ පරිසරයට හානි කරමිනුයි. පරිසරය, සමාජය හා ආර්ථිකය අතර තුලනයක් පවත්වා ගැනීමට අප අසමත්වී තිබෙනවා. අද වනවිට ලෝකයේ ජනගහනයෙන් 50%ක් නාගරික ජීවිත ගතකරමින් සිටිනවා. 2050 වනවිට එම සංඛ්‍යාව 80% ක් වනු ඇති බවට අපේක්ෂා කරනවා. බස්නාහිර මෙගා පොලිස් සැළසුම හා ඒ පිළිබඳ තක්සේරු වාර්තා සැළකුවොත් එය අද වනතෙක් ජනතාව අතට පත්වෙලා නෑ. මේ රටේ උගතුන් ,බුද්ධිමතුන් ඇතුළු මහජනතාව මෙම කරුණු පිළිබදව දැනුම්වත්ව, සමාජ සංවාදයක් සිදුවිය යුතුයි. මුළු ලෝකයේම ගමන් මාර්ගය වෙනස් කිරීමට නායකත්වය ලබාදී තිබෙන්නේ සිවිල් සමාජයයි. ශ්‍රී ලාංකික සිවිල් සමාජයටත් ඒ සම්බන්ධයෙන් විශාල වගකීමක් හා කාර්යභාරයක් පැවැරී තිබෙනවා.

තිරසාර සංවර්ධන අරමුණු දිනාගැනීමේ මගසැලැස්ම සංවර්ධන කිරීම සඳහා සාමාජික සංවිධානවල අදහස් යෝජනා ලබාගැනීමද එහි අධ්‍යාපන අරමුණු දිනාගැනීම පිළිබඳව වැඩිදුර සාකච්ඡා කිරීමද මෙම උපදේශනාත්මක සාකච්ඡාවේදී සිදුකෙරිණි. අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ (**CED**) සභාපති කේ ඩී පීරිස් මහත්මා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් ද මෙම උපදේශනාත්මක වැඩසටහනට සහභාගි වුහ.

# ඇස්ප්බේ වාර්ෂික කාර්යය මණ්ඩළ හමුව මෙවර ශ්‍රී ලංකාවේ දී



මූලික සහ වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ ආසියා දකුණු සහ පැසිෆික් කලාපීය සංවිධානයේ වාර්ෂික කාර්යය මණ්ඩල හමුව සහ ඉදිරි වසර සඳහා වූ ක්‍රමෝපායික සැළැස්ම සැකසීමේ වැඩමුලුව මෙවර ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී. මෙම වැඩමුලුව ශ්‍රී ලංකාවේදී සංවිධානය කිරීම සහ එහි කාර්යය සම්පාදන කටයුතු සිදුකරනු ලැබූයේ අධ්‍යාපන සංවර්ධන සන්ධානය මගිනි. ඇස්ප්බේ ආයතනයේ ඉහළ මට්ටමේ නිලධාරීන් සියලු දෙනා සහභාගී වු මෙම වැඩමුලුව බෙන්තොට අවානි බීච් හෝටලයේ දී මැයි මස 19 සිට 22 වැනිදා දක්වා පැවැත්විණි. මෙම අවස්ථාවට සහභාගී වීමට පැමිණි ආසියා කළාපයේ ධාරිතා සංවර්ධන නිලධාරී සිසිලියා මහත්මිය අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ රත්නපුර දිස්ත්‍රික්කයේ සාමාජික සංවිධානයන් වන පරිසර සහ ළමා අයිතීන් සුරැකීමේ සංවිධානය හා පරිසර හා ප්‍රජා සංවර්ධන තොරතුරු කේන්ද්‍රය සහ කලුතර දිස්ත්‍රික්කයේ ආසියා ලංකා සමාජ සංවර්ධන ආයතන නිරීක්ෂණය ලක්කළාය. අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සාමාජික සංවිධාන නියැලෙන වැඩසටහන් සහ ඔවුන් ක්‍රියාත්මක වන විවිධ වූ ක්ෂේත්‍ර පිළිබඳව අවබෝධ කරගැනීමටත් ඒවායේ



කාර්යය මණ්ඩලය සමග අදහස් හුවමාරු කරගැනීමටත් මෙහිදී හැකිවිය. කළාපයේ අනෙකුත් රටවල්වල අධ්‍යාපන සන්ධාන සාමාජික ආයතන සිදුකරන ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතීන් පිළිබඳව සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමටත් අත්දැකීම් හුවමාරු කරගැනීමටත් මෙම ක්ෂේත්‍ර චාරිකාව ප්‍රයෝජනවත් විය.

# අධ්‍යාපනයට පෞද්ගලික අංශයේ මැදිහත්වීමෙන් ඇතිවන බලපෑම පිළිබඳ දැනුම්වත් කිරීම





අධ්‍යාපන සංවර්ධන සන්ධානය සෑම විටම අධ්‍යාපන ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන නවතම උපනතීන් පිළිබඳව තම සාමාජිකයින් දැනුම්වත් කිරීමේ නිරතව සිටී. මේ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයට පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකයින් මැදිහත්වීම නිසා සිදුවිය හැකි බලපෑම පිළිබඳව දැනුම්වත් කිරීමේ වැඩමුළුවක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා 2017 මැයි මස 15 වැනි දින කොළඹදී පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය ලබාදුන්නේ මූලික සහ වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ ආසියා දකුණු සහ පැසිෆික් කලාපීය සංවිධානයේ ධාරිතා සංවර්ධන උපදේශිකා සිසිලියා සොරියානෝ මහත්මිය විසිනි.

මෙහිදී සාකච්ඡා වූ ප්‍රධාන කරුණු අතර කැපීපෙනෙන ලෙස පෞද්ගලික පාසල් සංඛ්‍යාත්මකව වර්ධනය වීම, අඩු ගාස්තුවක් අයකරනු ලබන පෞද්ගලික පාසල් ආසියාකරයේ ව්‍යාප්ත වීම, පුද්ගලික ටියුෂන්/ අතිරේක පන්ති සැළකිය යුතු මට්ටමෙන් ඉහළ යාම, රජයේ පාසල්වල ද විවිධාකාරයේ ගාස්තු අයකිරීම අඛණ්ඩව ක්‍රියාත්මක වීම, පෞද්ගලික අංශයේ සමාජ වගකීම් වැඩසටහන් යටතට අධ්‍යාපනය ඇතුළත්වීම සහ රජයේ සහ පෞද්ගලික අංශයේ පාර්ශවකරණයෙන් යුත් පාසල් පද්ධතීන් බිහිකිරීමේ ක්‍රියාවලිය වේගවත් වීම යන ඒවා ඇතුළත් විණි.

පෞද්ගලික පාසල් වඩාත් නම්‍යශීලී බැවින් තමන් කැමැති විෂයන් අධ්‍යයනය කිරීමට අවස්ථාව ලැබෙන බවත් අඩු ගාස්තු අයකරන බැවින් අඩු ආදායම් ලබන ජනතාවට වුවත් මේවායේ පහසුකම් ලබාගත හැකිබවත් මේවාට පක්ෂව අදහස් දක්වන පිරිස ප්‍රකාශ කරති. ඊට අමතරව පෞද්ගලික පාසල් රජයේ පාසල් වලට වඩා ගුණාත්මකභාවයෙන් ඉහළ සහ කාර්යක්ෂම බවටද ඔවුන් තර්ක කරති. ගුරුවරුන් සේවයට නොපැමිණීමේ අවස්ථාවන් අඩු බවත් අධ්‍යාපනය සඳහා අවශ්‍ය සම්පත් සොයා ගැනීමේ බරපතළ ගැටලුවට මෙයින් විසඳුම් ලැබෙන බවටත් ඔවුන් අදහස් දක්වති

සිසිලියා සොරියානෝ මහත්මිය විසින් මෙම කරුණු සම්බන්ධයෙන් අන්තර්ජාතික හා කළාපීය වශයෙන් දක්නට ලැබන තත්වයන් සම්බන්ධයෙන් ගැඹුරින් සාකච්ඡා කරන ලද අතර මෙම සාධක දේශීය සන්ධර්භයේ කොතරම් දුරට දක්නට ලැබේද යන්න ඉන් අනතුරුව විමසා බලන ලදී. නොමිළයේ ලබාදෙන අධ්‍යාපනයට අහිතකර බලපෑමක් ඇතිවන අවස්ථාවන්හිදී ක්‍රියාකළ යුතු ආකාරය ගත යුතු පියවර පිළිබඳව සාකච්ඡාවට ලක්වූ අතර මෙවැනි වාතාවරණයකදී තනි තනිව නොව සාමූහික ව කණ්ඩායමක් වශයෙන් ක්‍රියාත්මක වීමේ වැදගත්කම අවධාරණයට ලක්විය.


**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**
**අංක 439/6A සුදර්ශන මාවත. නාවල පාර, රාජගිරිය**
**Web: cedsrilanka.net**
**දුරකතනය : 0112887642**